# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 47 — 1973 පෙබරවාරි 15 වැනි බ්‍රහස්පතින්ද — 1973.02.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 152 |
| ජනාධිපතිතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 145 | මිළ පාලන දැන්වීම් ... ... ... | 161 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... | — | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 162 |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය ... ... ... | 148 | ආණ්ඩුවේ වන්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 151 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | " සුරාබද්ද ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | 178 |


සැළකිය යුතුයි.—පොදු පහසුකම් මණ්ඩල පනත් කෙටුම්පත සහ බද්ධ නිවාස අයිතිකම් පනත් කෙටුම්පත 1973 පෙබරවාරි මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේක වශයෙන් පළ කරන ලදී.

## ජනාධිපතිතුමාණන් කරන පත්කිරීම් ආදිය

1973 අංක 66

අංකය : ඩී. 298/ආර්ජීසිටී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක් සහ පත් කිරීමක්**

උසස් කිරීම

පහත නම් සඳහන් නිලධාරියා 1972 ජනවාරි 1 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් වශයෙන්—

මේජර් වල්ලිපුරම් රාමනාදන්, ල.කා.හ.

පත් කිරීම

1972 ජනවාරි 1 වැනි දින සිට ලංකා සෙවිච්ඡා බල සේනාවේ 1 වැනි ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරී වශයෙන්—

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) වල්ලිපුරම් රාමනාදන්, ල.කා.හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 2 වෙනි දින,
කොළඹ දී ය.

2-564—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

1973 අංක 67

අංකය : ඩී 298/ආර්ජීසිටී.

**යුධ හමුදා—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් 1973 පෙබරවාරි මස 01 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් වරුන් වශයෙන් :—

මේජර් ප්‍රැන්සිස් පෝල් චැප්මන්, ගැහේබ

මේජර් එලියතම්බි ජෝර්ජ් තේවනායගම්, ලසිරෙ

මේජර් ජෙරෝම් ගොතියේ බල්තසාර්, ගැහේබ

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 2 දින,
කොළඹ දීය.

2-561—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.




ජාතික පුස්තකාල හා ප්‍රලේඛන

## 1973 අංක 68

අංකය : ඩී. 17/ආර්ඊසීපී.

**යුධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීම අත්හැර යාම සහ පත් කිරීමක්**

පත් කිරීම අත්හැර යාම

යුද්ධ හමුදා පණතේ (357 අධිකාරය) 13 (1) වැනි වගන්තිය යටතේ පහත නම සඳහන් නිලධාරියා, 1972 දෙසැම්බර් මස 15 වෙනි දින සිට ආධුනිකයින් බඳවන නිලධාරි තනතුර අත් හරින ලදී :—

කපිතාන් ගාමිණී සේනසිංහ ද සිල්වා ජයරත්න, ශ්‍රීලයුසේබ.

පත් කිරීම

යුද්ධ හමුදා පණතේ (357 අධිකාරය) 13 (1) වැනි වගන්තිය යටතේ පහත නම සඳහන් නිලධාරියා 1972 දෙසැම්බර් මස 15 වෙනි දින සිට ආධුනිකයින් බඳවන නිලධාරියෙකු වශයෙන් :—

ලුතිනන් කුලරත්න අත්තනායක, ශ්‍රීලයුසේබ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 2 දින,
කොළඹ දීය.

2-563—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## 1973 අංක 69

අංකය : ඩී 250/ආර්ඊසීපී/2.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම් සඳහන් නිලධාරි තැන 1971 පෙබරවාරි මස 01 වැනි දින සිට කපිතාන් වශයෙන් :—

ලුතිනන් පතිරාජ අප්පුහාමිලාගේ කරුණාතිලක, ල.ස.ස.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 23 දින,
කොළඹ දීය.

2-566—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## 1973 අංක 70

අංකය : ඩී 250/ආර්ඊසීපී/2.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් 1972 ඔක්තෝබර් මස 11 වෙනි දින සිට කපිතාන් වරුන් වශයෙන් :—

ලුතිනන් වීරකොන්ද ආරච්චිගේ අසෝක ද සිල්වා, ල.සි.රෙ.

ලුතිනන් කුලතුංග ආරච්චිගේ මයිකල් ගොඩ්වින් කුලරත්න, ල.යු. පොලිස් සේ.බ.

ලුතිනන් තිත්තගල්ල ගමගේ මහින්දපාල ආරියරත්න, ල.යු.පො.දු.සේ.බ.

ලුතිනන් ලක්ෂමන් කුලතුංග, ල.ය.යු.බ.

ලුතිනන් කුලරත්න අත්තනායක, ල.යු.සේ.බ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 2 දින,
කොළඹ දී ය.

2-562—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## 1973 අංක 71

අංකය : ඩී. 250/ආර්ඊසීපී/1.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුනගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනවල සිට ලුතිනන් වරුන් වශයෙන් :—

දෙවෙනි ලුතිනන් මඩවිටවිතානගේ උපාලි ජයදේව ගුණසේකර පෙරේරා, ල.ඉ.—1972 නොවැම්බර් 14.

දෙවෙනි ලුතිනන් පින්සිරි ද සිල්වා දළුවත්ත, ලං.ඉ.—1972 නොවැම්බර් 14.

දෙවැනි ලුතිනන් කිත්සිරි ලක්ෂමන් රාසපුත්‍රම්, ල.වි.යා.ඉ.—1972 නොවැම්බර් 14.

දෙවැනි ලුතිනන් නන්හාමිගේ ගුණතිලක, ල.ඉ.—1972 නොවැම්බර් 14.

දෙවැනි ලුතිනන් කිරිපෝරුවගේ පියසෝම, ල.වි.යා.ඉ.—1972 නොවැම්බර් 20.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 2 දින,
කොළඹ දී ය.

2-565—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඩී. 1/ආර්ඊසීපී/79.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරයට පත් කිරීම පිළිබඳ සංශෝධනය කිරීම්**

1972 ඔක්තෝබර් මස 20 වෙනි සිකුරාදා දින අංක 30 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1972 අංක 184 දරණ නිවේදනය සංශෝධනය කිරීම :—

"ලංකා ශිෂ්‍ය භට නිලධාරී මොහිදීන් මොහමඩ් මීරා සායිබු—ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය.

ශිෂ්‍ය භට නිලධාරී තුවාන් මර්ජාන් බොහොරාන්—ලංකා ඉංජිනේරු බලකාය.

ශිෂ්‍ය භට නිලධාරි හේරත් රාලලාගේ අබේසිංහ පුෂ්පකුමාර සිරි පෙරේරා—ලංකා යුද්ධ හමුදා සේවා බලකාය.

ශිෂ්‍ය භට නිලධාරී හෙට්ටිආරච්චිගේ මහින්ද පෙරේරා—ලංකා පාබල හමුදාව"

වෙනුවට

"ශිෂ්‍ය භට නිලධාරී මොහම්මදු මොහිදීන් මීරා සයිබු—ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය.

ශිෂ්‍ය භට නිලධාරී තුවාන් මර්ජන් බෝරන්—ලංකා ඉංජිනේරු බලකාය.

ශිෂ්‍ය භට නිලධාරී හේරත් රාල්ලාගේ අබේසිංහ පුෂ්පකුමාරසිරි පෙරේරා—ලංකා යුද්ධ හමුදා සේවා බලකාය.

ශිෂ්‍ය භට නිලධාරී හෙට්ටි ආරච්චිගේ මහින්ද පෙරේරා—ලංකා පාබල හමුදාව" යනුවෙන් යොදන්න.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 2 දින,
කොළඹ දී ය.

2-567—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

1973 අංක 72

අංකය : ඩී/විඑප්/36.

**සුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු උපසේවයට මාරු කිරීමක්**

1972 ඔක්තෝබර් මස 01 වැනි දින සිට, පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ පොදු උප සේවයට මාරු කරන ලදී :—

මේජර් කනකෝන්තිරම් වෙල්වදුරෙයි., ලංඉ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි 2 දින,
කොළඹ දීය.

2-700—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 73

අංකය : ඩී/විඑප්/42 (IV)

**සුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

කපිතාන් (උපකරණ පාලක) හෙන්රි පිලිප් ජොනතන් පෙරේරා, ලං. ජා. ආ. මූ. 1972 දෙසැම්බර් මස 31 වෙනි දින සිට යුද්ධ හමුදාවේ ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගෙන ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 25 දින,
කොළඹ දී ය.

2-507—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 74

අංකය : ඩී. 202/ආර්සීපී (II)

**ශ්‍රී ලංකා නාවික හමුදාව—ස්ථිර බලකාය—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1973 මාර්තු මස 1 වැනි දින සිට කොමදෝරු වශයෙන් :—

කපිතාන් (විඑස්) දොන් බැසිල් ගුණසේකර, පී.එස්.සී., එන්. ඩී.සී.—ශ්‍රී.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 5 දින,
කොළඹ දී ය.

2-570/1—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 75

අංකය : ඩී. 202/ආර්සීපී (II).

(358 වෙනි අධිකාරය වන) නාවික පනත

ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් (358 වෙනි අධිකාරය වන) නාවික පනතේ 8 (1) වැනි වගන්තිය යටතේ 1973 මාර්තු 1 වැනි දින සිට කොමදෝරු, දොන් බැසිල් ගුණසේකර පී.එස්.සී., එන්.ඩී.සී. නාවික හමුදාධිපති වශයෙන් වැඩ බැලීමට සතුටින් පත් කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 5 දින,
කොළඹ දී ය.

2-570/2—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 76

අංකය : ඩී. 22/ආර්සීපී/228.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—ස්ථිර බලකාය—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම**

1973 පෙබරවාරි මස 01 වැනි දින සිට, ශ්‍රී ලංකා නාවික හමුදා ස්ථිර බලකායෙන් පහත සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගෙන ඇත.

උපදේශක ලුතිනන් කොමාන්ඩර් ජී. එම්. ඒ. පෙරේරා, ශ්‍රී. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි 1 වැනි දින,
කොළඹ දී ය.

2-508—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 77

අංකය : ඩී. 252/ආර්සීපී/5.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් 1973 ජනවාරි මස 1 වන දින සිට තාවකාලික ගෲප් කැප්ටන්වරු වශයෙන් :—

විං කොමාන්ඩර් හබරකඩ ආරච්චිගේ දොන් රණසිංහ (01011)—කාර්මික/සංඥා.

විං කොමාන්ඩර් ඇන්ටන් හක්ස්ලි පුවිමානසිංහ (01025) උපකරණ.

විං කොමාන්ඩර් වෙල්ලාරච්චිගේ දොන් හැරල්ඩ් සුමනපාල විජේසිංහ ගුණතිලක (01035)— පොදු රාජකාරී/නියමු.

විං කොමාන්ඩර් ඩික් කත්බට් පෙරේරා (01037)—පොදු රාජකාරී/නියමු.

විං කොමාන්ඩර් දොන් බන්දුල සනත් වීරත්න (01040)—පාලන.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි 9 දින,
කොළඹ දීය.

2-766—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

1973 අංක 78

අංකය : ඩී. 252/ආර්සීපී/3.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්කොඩ්රන් ලීඩර්වරුන් වශයෙන් :—

ප්ලයිට් ලෙප්ටිනන් ජෝශප් ලෙනාඩ් රන්ජිත් ගුණතිලක—(01093)—පාලන—1972 අගෝස්තු මස 1 වෙනි දින සිට,

ප්ලයිට් ලෙප්ටිනන් එතල්බට් සැඩින් බලම්ස්—(01104)—පාලන/රෙජිමේන්තු—1972 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට.

ප්ලයිට් ලෙප්ටිනන් ක්ලෝඩ් ඇන්තනි ඔස්මන්ඩ් ඩිරෙක්ස්—(01096)—පාලන/රෙජිමේන්තුව—1972 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 7 වෙනි දින,
කොළඹ දී ය.

2–708/1—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 79**

අංක : ඩී. 252/ආර්ටීසීටී/3.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීම්**

පහත නම් සඳහන් නිලධාරීන් 1973 පෙබරවාරි මස 12 වෙනි දින සිට ස්කොඩ්රන් ලීඩර්වරුන් වශයෙන් :—

කා/ස්කොඩ්රන් ලීඩර් ඇන්ටනි මොරිස් බෙන්සිල් ප්‍රනාන්දු—(01117)—පො.රා./නිරමු.

ප්ලයිට් ලෙප්ටිනන් ෆ්‍රැන්සිස් එඩ්ගාර් කුරේ—(01107)—පො.රා./නියමු.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 7 වෙනි දින,
කොළඹ දී ය.

2–708/2—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 80**

අංකය : ඩී. 361/ආර්ටීසීටී.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිලධාරීන් ද්විතීයනය කිරීම**

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන් අධිකාරී ලැබූ ශාඛාවන්හි ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය පවත්වා ගන්නා අතරම 1972 නොවැම්බර් මස 18 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පොදු රාජකාරී (නියමු) ශාඛාවේ සේවයට ද්විතීයනය කරනු ලැබ ඇත.

ප්ලයිට් ලෙප්ටිනන් පයියාගලගේ විමල් ආනන්ද ප්‍රනාන්දු—(01121)—මෙහෙයවීම්—ගුවන්.
ප්ලයිට් ලෙප්ටිනන් එඩ්වඩ් යෝගරාජ් බුළුල්—(01122)—පාලන.
ප්ලයිට් ලෙප්ටිනන් සේන රන්ජිත් රත්නපාල—(01123)—පාලන.
ප්ලයිට් ලෙප්ටිනන් ඩයිනීෂියස් මහින්ද ද සිල්වා සෙනෙවිරත්න—(01132)—පාලන.
ප්ලයිට් ලෙප්ටිනන් තිලකරත්න බණ්ඩාර පනන්වල—(01136)—පාලන.
ප්ලයිට් ලෙප්ටිනන් ඇරුණාචලම් නරේන්ද්‍ර—(01142).

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 පෙබරවාරි මස 7 වෙනි දින,
කොළඹ දී ය.

2–707—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 81**

අංකය : ඩී./වීඑප්/75.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්**

1973 ජනවාරි මස 01 වෙනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්—පයිලට් ඔෆිසර් තුවාන් කිච්ල් අමිත්ෆලීල්—පාලන/රෙජිමේන්තු—වී/0045

උතුමාණන් වහන්සේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 27 දින,
කොළඹ දී ය.

2–701—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

# අධිකරණ සේවා උපදේශක මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 82**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ 126(5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත්කිරීම් කර ඇත :—

අංකය : සීජේපී/ජේ. 16/73

එම්. ඩී. ජේසුරත්නම් මහතා 1973 ජනවාරි මස 1 දින සිට තවදුරට නියෝග කරන තෙක් අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් සහ මල්ලාකම්හි ක්‍රියා කරන යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ලමා මහෙස්ත්‍රාත් තැන සහ යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේපී/ජේ. 15/73.

එෆ්. එන්. ඩී. ජයසූරිය මහතා 1973 ජනවාරි මස 1 දින සිට තවදුරට නියෝග කරන තෙක් බම්බලපිටියේ පිහිටි ලමා මහෙස්ත්‍රාත් උසාවියේ කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ගම්පහ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ලමා මහෙස්ත්‍රාත් තැන, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ලමා මහේස්ත්‍රාත් තැන සහ පානදුරේ අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ලමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේපී/ආර්. 14/73.

ආර්. බී. රණරාජා මහතා 1973 ජනවාරි මස 1 දින සිට තවදුරට නියෝග කරනතෙක් අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් සහ (කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභා සීමාවතුල) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ලමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ (කුලියාපිටිය පළාත් ආණ්ඩු සභා සීමාවතුල) කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේපී/ටී. 3/73.

පී. එදුස්සූරිය මහතා 1973 ජනවාරි මස 1 දින සිට තවදුරට නියෝග කරන තෙක් අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් සහ මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ලමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීජේපී/ඒ. 10/73.

ඒ. බී. අළුවිහාරේ මහතා 1973 ජනවාරි මස 1 දින සිට තවදුරට නියෝග කරන තෙක් අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ලමා මහේස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑම්/ජී. 40/66.

එම්. ඉසෙඩ්. අයි. අසීස් මහතා 1973 ජනවාරි මස 1 වැනි දින සිට හෝ නැවත නියෝගයක් කරන තෙක් හෝ රත්නපුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ලමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ රත්නපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑම්/ජී. 40/66.

වයි. එච්. ගුණරත්න මහතා 1973 ජනවාරි මස 1 වන දින සිට නැවත නියෝගයක් කරන තෙක් අධිසංඛ්‍යා නිලධාරියෙකු වශයෙන් සහ අවිස්සාවෙල්ලේ අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ලමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑම්/ජී. 40/66.

ඒ. බී. අළුවිහාරේ මහතා 1973 පෙබරවාරි මස 01 වැනි දින සිට 1973 පෙබරවාරි මස 28 වන දින තෙක් එම්. ඊ. ධර්මවර්ධන මහතා නිවාඩු පිට සිටින තෙක් හෝ නැවත නියෝගයක් කරන තෙක් හෝ මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහේස්ත්‍රාත් තැන සහ මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේජීජ්. 49/64.

වී. ජේ. රාජරත්නම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් චාවකච්චේරි දි.උ. අංක 3152, 3587, 3825, 3490, 3489, 3791 සහ 3846 දරණ නඩුවල තීන්දුදීම පිණිස 1973 ජනවාරි මස 25 දින සිට පේදුරු තුඩුව අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේජීජී/50/54.

වී. ජේ. රාජරත්නම් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් පේදුරු තුඩුව ම.උ. අංක 6951 දරණ නඩුවේ තීන්දුව දීම පිණිස 1973 පෙබරවාරි මස 10 වැනි දින සිට පේදුරුතුඩුව අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේජ්ජ්/47/48(III).

සී. එල්. ටී. මූණමලේ මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් පානදුර දි.උ. 12060/පී දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස 1973 පෙබරවාරි මස 2 දින සිට පානදුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එම්. 11/62.

1973 ජනවාරි මස 29 සිට 31 දක්වා සී. ඊ. මෙන්ඩිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. කනගරත්නම් මහතා යාපනයේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ඩබලිව. 17/60.

1973 ජනවාරි මස 17 දින එම්. පී. විජේසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, බී. එම්. සෙනවිරත්න මහතා කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එස්. 38/71.

1973 ජනවාරි මස 20 වැනි දින ටී. සුන්දරලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. අලගයියා මහතා කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, කල්මුනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එස්. 38/71.

1973 ජනවාරි මස 26 සිට 31 දක්වා ටී. සුන්දරලිංගම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එන්. චින්නයියා මහතා කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, කල්මුනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ඩී. 29/66.

1973 පෙබරවාරි මස 3 සිට 7 දක්වා ආර්. එල් . ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එල්. ඩබලිව්. ප්‍රනාන්දු මහතා ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ජී. 25/63.

1973 ජනවාරි මස 29 සහ 30 දිනයන්හි ආර්. ඩී. බී. ජයසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. ඩී. සේනවීර මහතා අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ජේ. 12/52.

1973 ජනවාරි මස 22 සිට 24 දක්වා එස්. ජෝකනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, කේ. ඥානචන්ද්‍රන් මහතා පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එස්. 26/91.

1973 ජනවාරි මස 26 වැනි දින ජේ. සේනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඊ. ඒ. ජේ. ඩබ්ලිව්. සේරසිංහ මහතා ගාල්ල අතිරේක මහේස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එස්. 26/51.

1973 ජනවාරි මස 22 සහ 25 දිනයන්හි ජේ. සේනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එච්. ඊ. වීරසූරිය මහතා ගාල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එස්. 26/61.

1973 ජනවාරි මස 25 වැනි දින ජේ. සේනාතිරාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ආර්. වික්‍රමසිංහ මහතා ගාල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/පී. 7/67

1972 දෙසැම්බර් මස 29 සිට 31 දක්වා කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ටී. කරුණෛයිරත්නම් මහතා කල්මුනේ ක්‍රියා කරන මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/පී. 6/65.

1973 පෙබරවාරි මස 5 සිට 10 දක්වා ආර්. පරමකුරු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු,එස්. එම්. අබුතහිර් මහතා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ඩී. 27/64.

1973 ජනවාරි මස 26 සිට 29 දක්වා එම්. බී. ජී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, පී. මහෙස්වරන් මහතා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/එස්. 35/67.

1973 ජනවාරි මස 25 සිට 27 දක්වා එච්. ඩබලිව්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. එල්. එම්. රජීන් මහතා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය ; ජේඑල්/ජේ. 16/73.

1973 ජනවාරි මස 27 සිට 31 දක්වා එම්. ඩී. ජේසුරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජී. වී. බාලසිංහම් මහතා මල්ලාකම්හි ක්‍රියා කරන යාපනයේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය ; ජේඑල්/ඩී. 19/57.

1972 දෙසැම්බර් මස 19 වැනි දින කේ.සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ජේ. එස්. රාජපක්ෂ මහතා හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය ; ජේඑල්/එස්. 31/65.

1973 ජනවාරි මස 25 වැනි දින ඩී. එස්. ඩී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එස්. සූරවීර මහතා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : ජේඑල්/ඩබ්ලිව්.12/66.

1973 ජනවාරි මස 25 දින එන්. බී. ඩී. එස්. විජේසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, එම්. ඕ. එම්. තහීර් මහතා කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීඑල්ටී/ජේ/1972(II)

බී. ඩී. ප්‍රනාන්දු මහතා කොළඹ 16 අංක 16/790/70 සහ 16/852/70 සහ 16/436/69 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දු දීමට 1973 පෙබරවාරි මස 1 වැනි දින සිට 14 දින දක්වා කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීඑල්ටී/ජේ/1972(II)

එස්. ධර්මලිංගම් මහතා කොළඹ (13) 13/කේටී/2075, 13/කේටී/2314, 13/කේටී/2266, 13/කේටී/2307 සිට 13/කේටී/2310 දක්වා, 13/කේටී/2120, 13/කේටී/1242, (11/ජී/599–17/1040) 13/කේටී/247, (11/1606/70–17/212) 13/කේටී/446, (11/1925/70)—13/කේටී/1053, (11/1934/70)—13/කේටී/1056, (11/ජී/652)—13/කේටී/650, 13/කේටී/720, 11/942/69, 13/කේටී/138, 13/කේටී/1661, 13/කේටී/2263 . 13/කේටී/1257, 13/

කේ.ටී/2273, 13/කේටී/2272, 13/කේටී/2274, 13/කේටී/2276, 13/කේටී/1397, 13/කේටී/2066, 13/කේටී/2260, 13/කෙටී/2320, 13 කේටී/2311, 13/කේටී/2326, 13/කේටී/1934, 13/කේටී/1520, 13/කේටී/1521, 13/කේටී/1428, 8/36102/68—13/657/70, 2/1440/69, 13/572/70, 2/970/69, 13/351/69, 11/1855, 13/1100/70, 2/1439/69, 13/571/70, 1/1663/70, 13/723/70, 2/2466/70, 13/1176/70, 7/30735/69, 13/662/70, 7/1909/70, 13/1308/71, 13/1480/72, 13/එන්/1, 13/එන්/263, 13/එන්/271, 13/එන්/16, 13/එන්/161 සහ 13/එන්/54 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දු දීමට 1973 ජනවාරි මස 30 වැනිදින හා 1973 පෙබරවාරි මස 10 දින කම්කරු විනිශ්චය සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීඑල්ටී/ජීජී/1972(II).

එම්. ජී. එච්. ද අල්විස් මහතා කොළඹ 11/ජී/2109–2112 දක්වා 11/34826, 11/213/69, 11/429/69, 11/2194/71, 11/ජී/668, මාතර 11/මා/1348, 11/මා/663, 11/මා/17338, 11/මා/910, 11/මා/668, 11/මා/1227, 11/මා/858, 11/මා/1027, අවිස්සාවේල්ල 11/ඒ/1911, 11/ආර්/3356, 11/ඒ/16, 11/ආර්/19737, 11/ජී/1493, 11/ජී/1497, ගාල්ල 11/ජී/7054, 11/ජී/6022 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දු දීමට 1973 පෙබරාරි මස 1 වැනි දින සිට පෙබරවාරි මස 15 වැනි දින දක්වා කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : සීඑල්ටී/ජීජී/1972(II).

ටී. ගනේගොඩ මහතා කොළඹ (14) 14/409/71, 14/745/71, 14/1022/72 සිට 14/1025/72, සහ 14/1027/72 සිට 14/1029/72 දක්වා, 14/373/71, 14/698/72, 14/393/71, 14/473/71, අයිඩී/එල්ටී/14/1, 14/792/72, 14/857/72, 14/375/71, 14/376/71, 14/377/71, 14/378/71, 14/340/71, 14/480/71, 14/649/71, රත්නපුර (6) ආර්. 7187, ආර්. 6938, ආර්. 6949 දරණ නඩු ඇසීමට සහ අසා අවසානකර තීන්දුව දීම සඳහා 1973 පෙබරවාරි මස 1 දින සිට 15 වැනි දින දක්වා කම්කරු විනිශ්චය සභා සභාපතිවරයෙකු වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීජීජී/44/57

එන්. එච්. ප්‍රනාන්දු මහතා 1973 ජනවාරි මස 09 වැනි දින සිට 15 දින දක්වා හිඟුරක්ගොඩ ගම්බද උසාවියේ අංක 6996 සහ 6997 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමන්කඩුව කලාගම්පළාත උතුරු සහ කලාගම් පලාත් දකුණ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ හුරුළු පළාත දකුණ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීජීආර් 38/49

සී.ඒ.එස්.ඊ. ක්‍රිස්ටින් මහතා 1973 ජනවාරි මස 30 වන දින සිට 15 දින දක්වා පන්නල ගම්බද උසාවියේ අංක 17427 දරණ නඩුව ඇසීමට සහ අසා නිමකර තීන්දුව දීම පිණිස කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය පන්නල බිංගිරිය සහ දඹදෙනි හත් . ත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීජීජී/40/57

පී. ඩී. පී. විජේසේකර මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 ජනවාරි මස 30 වැනි දින සිට 15 දින දක්වා ආණමඩුව ගම්බද උසාවියේ අංක 6906 සහ 6907 දරණ නඩු ඇසීමට සහ අසා නිමකර තීන්දුදීම පිණිස පුත්තලම් දිස්ත්‍රික්කයේ පුත්තලම් පත්තු කඩවත් කල්පිටිය රාජවන්හි පලාත ප්‍රාදේශීය ආදායම නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ පිටිගල් කෝරලේ උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් සහ පිටිගල් කෝරලේ උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 13/69

1972 දෙසැම්බර් මස 13 දින සිට 15 දින දක්වා කේ. ජේ. ජස්ටින් පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු වජිර මාරසිංහ මහතා අවිස්සාවේල්ල දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් කෝරලේ පහල බුලත්ගම අටළුගම සහ පනාවල් කෝරලේ ගම්බද උසාවි සභාපති සහ බෙලිගල් කෝරලේ සහ කුරුවිට කෝරලේ අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/සී. 2/62

1972 දෙසැම්බර් මස 26 සහ 27 වැනි දිනයන්හි සී. ඒ. එස්. ඊ. ක්‍රිස්පින් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු චන්ද්‍රා බී. රැකව මහතා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙවමැදි හත්පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් සහ ගල්ගමුව නිකවැරටිය කුලියාපිටිය පන්නල බිංගිරිය සහ හිරියාල හත්පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි අති. . ක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 7/49

1972 නොවැම්බර් මස 10, 11, 13, 14, 15, 16 සහ 29 දිනයන්හි කේ. සින්න කම්බි මහතා නැති අතර හෝ නැ ත නි. මයක් කරනතුරු සී. රාසයියා මහතා යාපනය සහ ජේදුර තුඩුව දිස්ත්‍රික්කයන්හි උතුරු වලිකාමම් නැගෙන හිර වලිකාමම් සහ යාපනය ගම්බද උසාවි සභායකි වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 12/62

1972 දෙසැම්බර් මස 18, 19, 23 සහ 26 වැනි දිනයන්හි සී. ජී. එල්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු එස්. එල්. කුමාරසිහ මහතා හේවාගම් කෝරලේ නැගෙනහිර හේවාගම් කෝරලේ බටහිර සල්පිටි කෝරලේ සහ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 9/61

1972 දෙසැම්බර් මස 22, 23, 26 සහ 27 දිනයන්හි එම්. ඒ. සී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඩී. කිව්. හලහකෝන් මහතා මීගමුව දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරලේ උතුර ඒ සහ බී අළුත්කුරු කෝරලේ දකුණ සහ සියනෑකෝරලේ බස්නාහිර (අධිකාරිපත්තු) ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය ; පී.එල්/ඩබ 4/71

1972 දෙසැම්බර් මස 27 වැනි දින ජී. එස්. වත්තේගෙදර මහතා නැති අතර හෝ කුැවත නියමයක් කරනතුරු එච්. බී. රත්නායක මහතා බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ වියළුව ගම්බද උසාවි සභාපති සහ බුත්තල අතිරේක ගම්බද උසාවි හභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.එල්/ආර්. 6/67

1972 දෙසැම්බර් මස 26 සහ 27 දිනයන්හි එස්. රාජනන්දන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. සී. ජබාර් මහතා කල්මුනේ දිස්ත්‍රික්කයේ පානම සහ අක්කරෙයිපත්තු ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබලිව්. 13/71

1972 නොවැම්බර් මස 22 සහ 23 දිනයන්හි සහ 1972 දෙසැම්බර් මස 22 සහ 23 වැනි දිනයන්හි ටී. බී. වීරසූරිය මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු ටී. යූ. කරවිට මහතා අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමන්කඩුව කලාගම් පළාත උතුරු සහ කලාගම් පළාත දකුණ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් සහ දකුණු හුරුළු පළාත අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 5/61

1972 නොවැම්බර් මස 10 වැනි දින සී. ආර්. රාජසිංහම් මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු , පී. සුන්දරලිංගම් මහතා ජේදුරුතුඩුව දිස්ත්‍රික්කයේ තෙන්මරච්චි පච්චිලයිප්පලෙයි කරච්චි සහ පූනාකාරි තුන්නු කායි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ආර්. 5/61

1972 නොවැම්බර් මස 3 සහ 6 වැනි දිනයන්හි සී. ආර්. රාජසිංහම මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු වී. සෙල්ලයියා මහතා ජේදුරු තුඩුව දිස්ත්‍රික්කයේ තෙන්මරච්චි පච්චිලයිප්පලෙයි කරච්චි සහ පූනාකාරි තුන්නුකායි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩබ්. 5/56

1972 නොවැම්බර් මස 28 වැනි දින සී. බී. හුණුකුඹුර මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු එල්. බී. කරල්ලියද්ද මහතා මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ හාරිස්පත්තුව පාතහේවාහැට උඩ හේවාහැට ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය ; පීඑල්/එස් 16/62

1972 නොවැම්බර් මස 10 වැනි සහ 11 වැනි දිනයන්හි කේ. ෂන්මුගනාදන් මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු ජී. පී. පැට්‍රික් මහතා මඩකල්පුව දිස්ත්‍රික්කයේ එරුවිල්පොරතිවු සහ දකුණු මානමුනෙයි පත්තු ගම්බද උසාවි සභාපති සහ උතිරු මාන්මුනෙයි පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.එල්/එස්.

1972 නොවැම්බර් මස 9 වැනි සහ 10 වැනි දිනයන්හි ඇම්. සලහුදීන් මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු ජයරාණි පීරිස් මෙනවිය බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ සහ වැල්ලවාය ගම්බද උසාවි සභාපතිවශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.එල්/කේ. 8/71

1973 ජනවාරි මස 15 සහ 17 වැනි දිනයන්හි කේ. කණපතිපිල්ලේ මහතා නැති අතර හෝ නැවත නිමයක් කරනතුරු කේ. පී. සිතාරාමන් මහතා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් පත්තු ගම්බද උසාවි සභාපති සහ කඩ්ඩුකුලම් සහ තම්පලාකාමම් පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.එල්/පී. 8/5

1972 නොවැම්බර් මස 10 වැනි දින එෆ්. ජී. බී. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. එෆ්. එච්. ද අල්විස් මහතා ගාල්ල දිස්ත්‍රික්කයේ ගහබොඩ සහ හිනිදුම් පත්තු සතර පේරුව සහ තල්පේ පත්තු ගම්බද උසාවි සභාපති සහ වැල්ලබඩ පත්තු අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පිඑල්/එන්. 3/59.

1972 දෙසැම්බර් මස 28 වැනි දින ජී. නුගවෙල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එස්. ඒ. යටවර මහතා මහනුවර දිස්ත්‍රික්කයේ මාත ලේ දකුණ සහ නැගෙනහිර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.ජේ.ජී./54/57.

1973 ජනවාරි මස 9 දින සිට 13 වැනි දින දක්වා සහ 15 වැනි දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු නිශ්ශංක උඳලාගම මහතා කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිනිගොඩ බෙලිගල් සහ පරණකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීජේජී. 54/57.

1973 ජනවාරි මස 1 වැනි දින සිට 6 දක්වා සහ 8, 17, 19, 20 දිනයන්හි හෝ නැවත නියමයක් කරනතුරු ප්‍රේමචන්ද්‍ර රණතුංග මහතා කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිනිගොඩ බෙලිගල් සහ පරණකුරු කෝරලයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

ලයනල් සමරතුංග,
අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ
ලේකම්.

1973 පෙබරවාරි මස 7 වැනි දින,
අධිකරණ සේවා උපදේශක හා විනය මණ්ඩල කාර්යාලය,
තැ.පෙ. 573,
කොළඹ 5 දීය.

2–754—73.02.15 දින අංක 47 දරන ගැසට් පත්‍රය

---

## වෙනත් පත්කිරීම් ආදිය

**1973 අංක 83**

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

ගල්කිස්සේ රත්මලාන වත්තේ "අතුල මාවතේ" එප් 89 දරණ ස්ථානයේ පදිංචි හේවාපොන්සේකාගේ විල්ප්‍රඩ් කිංස්ලි පොන්සේකා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි වූ ජනවාරි මස 15 දින,
කොළඹ දී ය.

2–497—73.02.15 දින අංක 47 දරන ගැසට් පත්‍රය

---

**1973 අංක 84**

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

(රෝ/0205)

දෙබම්මුල්ලගේ සිරිල් වික්‍රමසිංහ මහතා දෙකටන වාසස්ථානය සහ කාර්යාලයද පුවුපාගල අතුරු කාර්යාලයද ඇතුව ගම්පහ අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි වූ ජනවාරි මස 15 වන දින,
කොළඹ දී ය.

–2501—73.02.15 දින අංක 47 දරන ගැසට් පත්‍රය

---

**1973 අංක 85**

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

(රෝ/0205)

මිල්ලවිතන්ත්‍රිගේ ජේම්ස් පෙරේරා ගුණතිලක මහතා මීගමුවේ වාසස්ථානය සහ කාර්යාලයද ඇතුව මීගමුව අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි වූ ජනවාරි මස 15 වන දින,
කොළඹ දී ය.

2–500—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 86**

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

යාපනයේ හතරවෙනි හරස් වීදියේ අංක 75 දරණ 'තිරවිය වාසනි" පදිංචි කාමෙලින් කුලිස්ටා ශාන්තිනි පැට්‍රික් මෙනෙවිය යාපනය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි වූ ජනවාරි මස 17 දින,
කොළඹ දී ය.

2–499—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 87**

**නොතාරිස් ආඥා පනත (107 වන අධිකාරය)**

පොල්ගහවෙල රත්මල් ගෙඩ "ගල්කන්ද" පදිංචි සෙනරත් මිද්දුම බණ්ඩාර දසනායක මහතා කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ලේකම්.

1973 ක්‍රි වූ ජනවාරි මස 15 දින,
කොළඹ දී ය.

2–498—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

1973 අංක 88

**නොතාරිස් ආඥා පනත (107 වන අධිකාරය)**

(රෝ/0205)

වටබැද්දෙ ආරච්චිගේ ජස්ටින් එම්මානුවෙල් සිල්වා මහතා බණ්ඩාරවෙල වාසස්ථානය සහ කාර්යාලය ද වැලිමඩ අතුරු කාර්යාලය ද ඇතුව බදුල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍යපරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක් වූ ජනවාරි මස 15 දින,
කොළඹ දී ය.

2–494—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නිවේදන

**1950 අංක 10 දරණ කොළඹ වරාය (පාලන) පනත**

1950 අංක 10 දරණ කොළඹ වරාය (පාලන) පනතේ 13 වන වගන්තිය යටතේ නැව් කටයුතු හා සංචාරක කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලදුව, 1972 ඔක්තෝබර් මස 23 වැනි දින අංක 30/3 දරණ ශ්‍රී ලංකාවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝග ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කොට ඇති බව එම පනතේ 14(4) වගන්තිය යටතේ මින් දැනුම් දෙනු ලැබේ.

පී. බී. කරඳවල,
නැව් හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

කොළඹ, 73.1.30.

2–765—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)**

864

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් 243, අළුත්කඩේ වීදිය, කොළඹ 12 පදිංචි රාසරත්නම් බාලේන්ද්‍ර මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 ක් වූ ජනවාරි මස 15 වන දින,
කොළඹ දී ය.

2–502—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 47/53.

**ධීවර ආඥාපනත**

(212 වැනි අධිකාරය වන) ධීවර ආඥාපනතේ 20 (II) සහ 33 වැනි වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ධීවර ඇමතිවරයා විසින් පනවනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගය.

ජෝර්ජ් රාජපක්ෂ,
ධීවර ඇමති,

1973 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1957 අප්‍රේල් මස 5 වැනි දින අංක 11,103 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1957 වාට්ටුවාකල් ධීවර නියෝගවල 3 වැනි නියෝගයේ (I) (ආ) ඡේදයේ අගට පහත සඳහන් අතුරු විධානය එකතු කිරීමෙන් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"මෙම නියෝගයේ ඉහත සඳහන් විධිවිධාන වලට පටහැනිව කුමක් සඳහන් වුවද, ඒ ගැන නොසලකා උපලේඛන ගත ප්‍රදේශයන් අතුරින් යම් ප්‍රදේශයක පදිංචිව සිටින යම් තැනැත්තකුට 3 (I) (අ) වැනි නියෝගය යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට 3 (2) වැනි නියෝගය අනුව නොහැකි වී නම් හෝ වලක්වනු ලැබුවේ නම්, ඔහු කවර හෝ උපලේඛනගත ප්‍රදේශයක දිගටම පදිංචිව සිටියේ නම් හා මෙම නියෝග වලංගු කරනු ලැබූ කාලයේදී ධීවරයකු වශයෙන් රැකියාවේ යෙදී සිටියේ නම් 3 (I) (අ) නියෝගය යටතේ බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට ද, බලපත්‍රයක් ලබා ගැනීමටද ඔහුට අයිතියක් තිබෙන්නට ඇත යන්න ගැන නිසි පරීක්ෂණයක් පවත්වා හැඟීමකට පත්වීමෙන් අනතුරුව මණ්ඩලය විසින් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් පතක් පිළිගැනීම හා බලපත්‍රයක් නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතුය."

2–505—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**1954 අංක 37 දරණ ජාතික නිවාස පනත**

49 ඡේදය යටතේ සහතිකය

8939

නිවාස හා ගොඩනැගිලි ඇමති, පීටර් ජෙරාල්ඩ් බර්තොලමියුස් කෙනමන් වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මඟින් අත් කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

පී. ජී. බී. කෙනමන්,
නිවාස හා ගොඩනැගිලි ඇමති.

1973. 1. 9 දින,
කොළඹ දීය.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ වැල්ලවත්ත උතුර පිහිටි හැව්ලොක් පාර අද්දර මයුර පෙදෙසෙහි වරිපනම් (අංක 432 හැව්ලොක් පාර) ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම්ව ඇති රූඩ් 1, පර්චස් 23 ක පමණ ප්‍රමාණයයක ඉඩම් කොටසක් :—

උතුරට : මයුරා පෙදෙස ;

නැගෙනහිරට : හැව්ලොක් පාර ;

දකුණට : වරිපනම් අංක 432 පී සහ තවත් පුද්ගලික ඉඩම් කොටසක් ;

බස්නාහිරට : වැල්ලවත්ත රෙදි මෝලට අයිති ඉඩම්.

2–688—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

### සමගි මණ්ඩල පනත

**ආඥාව**

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1971 අප්‍රේල් මස 8 වැනි දින අංක 14,953 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහිවූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 12 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මහනුවර දිස්ත්‍රික්කය තුල පිහිටි මැදසියපත්තුව (මැ. දූ.) ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායක සීන්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) මැදමහනුවර, මොරගහමුල පදිංචි කෝට්වෙ මුදියන්සේලාගේ හෙට්ටිගෙදර හීන්බණ්ඩා මහතා.

(2) මැදමහනුවර පදිංචි අහංගම විතානගේ ශ්‍රියානන්ද විජේවර්ධන මහතා.

(3) මැදමහනුවර පදිංචි ලියනරාලලාගේ ප්‍රේමතිලක මහතා.

(4) මැදමහනුවර පදිංචි හවුපේ ලයනල් ලියනගේ මහතා.

(5) මැදමහනුවර පදිංචි අහංගම විතානගේ ලයනල් අබේගුණසේකර මහතා.

(6) මැදමහනුවර, උඩතැන්න පදිංචි මඩවල බෝගහ කොටුවේ විමලසිරි මහතා.

(7) මැදමහනුවර, උඩතැන්න පදිංචි උඩගෙදර චන්ද්‍රසේන මහතා.

(8) මැදමහනුවර පදිංචි ලොකුගම්හේවාගේ ජේම්ස් සිංඤෝ මහතා.

(9) මැදමහනුවර, වතුලියද්ද, පදිංචි පරගහපැලේ ගෙදර නවරත්න බණ්ඩා මහතා.

(10) මැදමහනුවර, වතුලියද්ද පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ සිංගිරිබණ්ඩා මහතා.

(11) මැදමහනුවර පදිංචි ලියනආරච්චිලාගේ තෙපානිස් අප්පුහාමි මහතා.

(12) මැදමහනුවර, මහදොරලියද්ද පදිංචි තිවිහාමි මුදියන්සේලාගේ උඩකුඹුරේ ගෙදර හීන්බණ්ඩා මහතා.

(13) මැදමහනුවර, මහදොරලියද්ද පදිංචි වනසින් ගෙදර විජේබණ්ඩා මහතා.

(14) මැදමහනුවර, මහදොරලියද්ද, පදිංචි රත්නායක මුදියන්සේලාගේ බන්නැක්ගෙදර මුදියන්සේ මහතා.

(15) මැදමහනුවර, මහදොරලියද්ද පදිංචි දූනුතිලක මුදියන්සේලාගේ පිකිරිබණ්ඩා මහතා.

(16) මැදමහනුවර, අම්බාගේ පදිංචි රණසිංහ ආරච්චිලාගේ පොඩි අප්පුහාමි මහතා.

(17) මැදමහනුවර, අම්බාගේ පදිංචි සෙනෙවිරත්න ඒකනායක මහතා.

(18) මැදමහනුවර පදිංචි රාජපක්ෂ ගෙදර බෝධිදාස මහතා.

(19) තෙල්දෙනිය, දුනුවිල පදිංචි යාපා මුදියන්සේලාගේ චන්ද්‍රරත්න මහතා.

(20) තෙල්දෙණිය, දුනුවිල පදිංචි බද්දේවීරකෝන් මුදියන්සේලාගේ කරුණාරත්න බණ්ඩා පාලම කුඹුර මහතා.

(21) තෙල්දෙණිය, දුනුවිල පදිංචි රාජපක්ෂ බලගොල්ලේ ගෙදර බෝධිදාස මහතා.

(22) තෙල්දෙණිය, දුනුවිල පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ රිටිගහලකන්ඳේ ගෙදර වීරකෝන් බණ්ඩා මහතා.

(23) තෙල්දෙණිය, දුනුවිල පදිංචි වාසල මුදියන්සේලාගේ පරගහකැලේ ගෙදර රත්බණ්ඩා මහතා.

(ආ) මැදමහනුවර, මොරගහමුල පදිංචි කෝට්වෙ මුදියන්සේලාගේ හෙට්ටිගෙදර හීන්බණ්ඩා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 පෙබරවාරි මස 2 වැනි දින,
කොළඹ.
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

2–711—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය

1964 අංක 16 දරණ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (සංශෝධන) පනතින් සංශෝධනය කර ඇති 1959 අංක 23 දරණ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනතේ 7(4) (අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව, විදේශීය හා දේශීය වෙළඳ ඇමති, පිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, ඉහත කී පනත යටතේ ඇති කරන ලද ආයතන සභාවට සාමාජිකයෙකු වශයෙන් 1973 දෙසැම්බර් මස 14 වැනි දිනෙන් අවසන් වන කාල සීමාව සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි පහත නම් සඳහන් කරන අය පත් කරමි:—

ලොකුකැටගොඩගේ නිහාල් ලක්ෂමන් පෙරේරා

පී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1973 පෙබරවාරි මස 07 දින,
කොළඹ 2,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ දීය.

2–610—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### 1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ නීතිගත සංස්ථා පනත

**දැන්වීමයි**

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ නීතිගත සංස්ථා පනතේ වගන්ති 47 (1) යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව සළසල වෙත, 1972.1.18 දින අංක 14,993/44 දරණ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළවූ පැවරීමේ නියෝගය අනුව එහි සඳහන් දේපල, කොටස් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් වෙනුවෙන් මවිසින් වන්දි නිගමනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

පැවරීමේ නියෝගයට අයත් උපලේඛනයේ කොටස් අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් ද, ඔවුන්ට අයත් කොටස් ප්‍රමාණයන් ද, එයට අදාල නිසි අංකද, සවිස්තරව සඳහන් කර ඇත.

ඉහත පනතේ වගන්ති 47 (2) ට අනුව මෙකී ප්‍රසිද්ධ කරන ලද දේපල සම්බන්ධයෙන් හිමිකම් ඇති සියල්ලන් වෙත වන්දි නියමනයට පෙර ඔවුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වන බලයලත් නියෝජිතයෙකු මගින් හෝ ප්‍රසිද්ධ කරන ලද දේපල වෙනුවෙන් වටිනාකම් පිළිබඳව ම විසින් වන්දි නිගමනය කිරීමට පෙර මා ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කිරීමට අයිතියක් ඇති බව මෙයින් දැනුම් දෙමි.

එවැනි සාක්ෂි ඉදිරිපත් කිරීමට කැමති සියළු අය පුද්ගලිකව හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයෙකු මගින් හෝ කොළඹ 6, සැවෝයි ගොඩනැගිල්ලේ තුන්වැනි මහලේ පිහිටි තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයට 1973 මාර්තු මස 10 වෙනි දින පෙ. ව. 9 ට පැමිණ එසේ කළයුතුය.

එල්. ඕ. ද සිල්වා,
වැඩ බලන ප්‍රධාන තක්සේරුකරු.

1973 ජනවාරි මස 29 දින,
තක්සේරු දෙපාර්තමේන්තුව,
සැවෝයි ගොඩනැගිල්ල, කොළඹ 6.

2–485—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**මිල පාලන පනත**

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1972 දෙසැම්බර් මස 07 වැනි දින අංක 36/6 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය ධාන්‍ය ඇට වර්ග පිළිබඳ අංක සී. 519 වැනි අංකය දරන ආහාර මිල නියෝගය, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1973.1.29 වැනි දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. පී. වී. ඒ. ජේ. ජී. සේනාරත්න,
වැඩ බලන ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

2–548—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 34/57.

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එකී සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1973 මාර්තු මස 10 දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක් ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ
පඩිපාලක සභාවේ සභාපති.

1973 පෙබරවාරි මස 7 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

ගඩොල් හා උළු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් කරන ලදුව 1961 අගෝස්තු මස 25 වැනි දින අංක 12,617 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ නිවේදනයේ උපලේඛනයෙහි දක්වා ඇත්තාවූ ද කලින් කල වෙනස් කරන ලද්දාවූ ද තීරණ, එම උපලේඛනයෙහි V වැනි කොටසේ "ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)" යන ශීර්ෂය යටතේ ඇති 8 වැනි ඡේදයේ (අ) අනුච්ඡේදය වෙනුවට පහත දැක්වෙන අළුත් අනුච්ඡේදය ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය :—

"ආණ්ඩුවේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)"

(අ) මේ ඡේදයෙහි හා 9 වන ඡේදයෙහි විධිවිධාන වලට යටත්ව, සෑම සේවා යෝජකයකු ම විසින් තමා යටතේ සේවයෙහි යොදවා ඇති සියළුම කම්කරුවන්ට, 1971 අංක 29 දරන නිවාඩු පනතේ අර්ථානුකූලව පහත සඳහන් ආණ්ඩුවේ නිවාඩු දවස් පඩි සහිත දින වශයෙන් දිය යුතුය—

(1) දෙමළ තෛපොන්ගල් දිනය ;
(2) සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනට පෙරතුවම වූ දිනය ;
(3) සිංහල සහ දෙමළ අලුත් අවුරුදු දිනය ;
(4) මිලාඩ්-උන්-නබි (මොහොමඩ් නබිනායක තුමාණන් වහන්සේ උපන් දිනය) ;
(5) මැයි දිනය (මැයි 1) ;
(6) ජනරජ දිනය (මැයි 22) ;
(7) සිංහල වෙසක් මාසයේ පුන් පොහෝ දිනයට ඉක්බිති වම එළඹෙන දිනය ;
(8) බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය (සැප්තැම්බර් 26 ;
(9) නත්තල් දිනය.

2–571—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

අංක : පී. 23/කො. 958/71

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

**4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි**

මෙම නියෝගය අනුබද්ධිත වැඩ බලන කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳ පැට්රික් මිරාල් මහතා, 31, කටුවාපිටිය පාර, මීගමුව සහ බ්‍රවුන්ස් ග්‍රෑප් මොටෙල්ස් ලිමිටඩ්, අංක 481, ඩාර්ලි පාර, කොළඹ.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු, ගම්පහ ආනන්ද ජයසිංහ මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 ජනවාරි මස 25 දින,
කොළඹ දීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

පැට්රික් මිරාල් මහතා, 31, කටුවාපිටිය පාර, මීගමුව.

සහ

බ්‍රවුන්ස් ග්‍රෑප් මොටෙල්ස් ලිමිටඩ්, අංක 481, ඩාර්ලි පාර, කොළඹ.

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

**ආරවුලට හේතුව පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුව් පවත්නා කාරණය වනුයේ බ්‍රවුන්ස් ග්‍රෑප් මොටෙල්ස් ලිමිටඩ්හි පාලක පක්ෂය විසින් පැට්රික් මිරාල් මහතාගේ සේවය අවසන් කිරීම යුක්ති සහගතද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

1972 දෙසැම්බර් මස 19 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ජෙ. පී. ඒ. සිරිවර්ධන,
වැඩ බලන කම්කරු කොමසාරිස්.

2–493—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## නිවැරදි කිරීම්

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

1970.12.31 වැනි දින අංක 14,938/11 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සහ 1971.5.7 වැනි දින අංක 14,957 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ 1972.05.05 වැනි දින අංක 15,009 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 10 (3) වැනි වගන්තිය යටතේ වූ දැන්වීම් පහත දැක්වෙන නිවැරදි කිරීම් සමග කියවිය යුතුය :—

#### 28—පානදුර මැතිවරණ කොට්ඨාශය

1. "ඊ" ඡන්ද කොට්ඨාශ විස්තරයේ දෙවැනි ඡේදියේ "බයස් පෙදෙස" යන වචන වෙනුවට "ග්‍රේස් පීරිස් මාවත" යන වචනද, "මොරවින්න පාර" යන වචන වෙනුවට "කවීරාජ මාවත" යන වචන ද ආදේශ කිරීමෙන්

2. "ඩබ්ලිව්" ඡන්ද කොට්ඨාශ විස්තරයේ හතර වැනි ජේලියේ "වලප්ල හරස් පාර" යන වචන වෙනුවට "ජෝතිරතන මාවත" යන වචන ද පස් වැනි පේලියේ "වලපොල පටුමග" යන වචන වෙනුවට "ප්‍රභාන්දු පාර" යන වචනද ආදේශ කිරීමෙන්

3. "කියුකියු" ඡන්ද කොට්ඨාශ විස්තරයේ දෙවැනි ජේලියේ "දුම්රියපොල පාර" යන වචනවලට පසුව "උපාලි මාවත" "ඇම්. ඊ. කුරේ මාවත", "සාන්ත මරියා පටුමග" සහ "මහින්දාරාමය පාර" යන වචන ඇතුළත් කිරීමෙන්

කේ. එන්. ඩබ්ලිව්. අබේසේකර,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි තැන,
අංක 28—පානදුර මැතිවරණ කොට්ඨාශය.

1973 ජනවාරි මස 30 වැනි දින,
කළුතර මැතිවරණ කාර්යාලයේදීය.

2-560—73.02.15 දින අංක 47 දරන ගැසට් පත්‍රය

---

අංක : ටී. 23/නො 601/72.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත

#### 4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශ්වයක් වශයෙන් කටුනායක ආර්. ආර්. විජේසේකර මහතා ද අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 11, කෙලින් වීදියේ, නිව් කොන්සිස්ටරි ගොඩනැගිල්ලේ, තැ. පෙ. 559 හි කේ. ඇම්. ඝා සහ සමාගමේ කොටස්කරුවන් වන කේ. ඇම්. ඝා, 41, 1/9, බේස්ලයින් පාර, කොළඹ 8, ඒ. ඇන්. මූස්බෝයි, 1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5 සහ ඇන්. මූස්බෝයි, 1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1958 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගල්කිස්සේ පිරිවෙන පාරේ අංක 54 හි පදිංචි අද්වකාත් ජී. ඩබ්ලිව්. එදිරිවීර මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 පෙබරවාරි මස 02 දින,
කොළඹ දී ය.

### ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත

එක් පාර්ශ්වයක් වශයෙන් කටුනායක ආර්. ආර්. විජේසේකර මහතා ද, අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 11, කෙලින් වීදියේ, නිව් කොන්සිස්ටරි ගොඩනැගිල්ලේ තැ. පෙ. 559 හි කේ. ඇම්. ඝා සහ සමාගමේ කොටස්කරුවන් වන කේ. ඇම්. ඝා, 41, 1/9, බේස්ලයින් පාර, කොළඹ 8, ඒ. ඇන්. මූස්බෝයි, 1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5 සහ ඇන්. මූස්බෝයි, 1, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5,

අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි

#### ආරවුලට හේතු වී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ආර්. ආර්. විජේසේකර මහතා සහ කේ. ඇම්. ඝා සහ සමාගමේ ඉහත සඳහන් කොටස්කරුවන් අතර පවතින කාර්මික ආරවුල පහත දැක්වෙන ආකාරයට වේ.

(1) කේ. ඇම්. ඝා සහ සමාගමේ පාලක පක්ෂය විසින් ආර්. ආර්. විජේසේකර මහතාගේ සේවය අවසන් කිරීම යුක්තිසහගත ද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත්,

(2) ඔහු විසින් කරන ලද පෙර සේවය සඳහා ආර්. ආර්. විජේසේකර මහතා පාරිතෝෂික දීමනාවකට හිමිකම් ඇත්තේ ද, එසේ නම්, කුමන ප්‍රමාණයක පාරිතෝෂික දීමනාවක් ඔහුට ගෙවිය යුත්තේ ද යන්නත් පිළිබඳව වේ.

1973 ජනවාරි මස 26 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

2-704—73.02.15 දින අංක 47 දරන ගැසට් පත්‍රය

---

### උතුරු පළාතේ රෙගුලාසි

සිරගුදැල් (රිවිදැල්) සම්බන්ධයෙන් දැනට උතුරු පළාතේ බල පැවැත්වෙන රෙගුලාසි ප්‍රතිශෝධනය කිරීම පිළිබඳව විභාග කළ ධීවර අමාත්‍යාංශයේ සහකාර ලේකම්, වී. එල්. සී. පීටර්ස් මහතාගේ වාර්තාව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

මෙම වාර්තාවේ සඳහන් වන කිසියම් කාරණයක් සම්බන්ධයෙන් කරුණු සැලකිරීම් ඉදිරිපත් කිරීමට කැමති ඕනෑම අයෙකුට ඔවුන්ගේ ලිඛිත කරුණු සැලකිරීම් කොළඹ 3, තැ. පෙ. 531, ධීවර අධ්‍යක්ෂ යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් 1973 මාර්තු 31 වැනි දිනට හෝ ඊට පෙර හෝ ලැබෙන සේ එවීමෙන් එසේ කළ හැකිය.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1973 ජනවාරි 25 දින,
කොළඹ දීය.

#### සිරගුවදැල් (රිවිදැල්) පිළිබඳව උතුරු පළාතේ බල්පැවැත්වෙන රෙගුලාසි සංශෝධනය කිරීම පිළිබඳ වාර්තාව

සිරගුවදැල් (රිවිදැල්) සම්බන්ධයෙන් උතුරු පළාතේ බල පැවැත්වෙන රෙගුලාසිවල යෝග්‍යතාවය හෝ ප්‍රමාණවත් භාවය හෝ වෙනත් කරුණු පිළිබඳව මෙම රෙගුලාසි සංශෝධනය කිරීමේ අරමුණ ඇතිව, 1967 දී නියෝජනයන් කැඳවන ලදී.

මේ සම්බන්ධයෙන් ලිඛිත නියෝජන 22ක් ලැබුණි. එකී නියෝජනයන් ඉදිරිපත් කළාවූ පාර්ශවයන් සමග 1968 වර්ෂය තුළ යාපනයේදී සම්මුඛ සාකච්ඡා පවත්වන්ට යෙදුණු අතර ඔවුන් විසින් ඉදිරිපත් කරන්ට යෙදුනු කරුණු සැල කිරීම් පිළිබඳව විභාග කරන ලදී. එකී විභාගයේ කාර්‍යයන් සඳහා එම පාර්ශ්වයන් කණ්ඩායම් 13 එක් රැස් කිරීමට පහසුවෙන් ඉඩකඩ සැලසුණි.

ඉදිරිපත් කරන්ට යෙදුණු කරුණු සැලකිරීම් පිළිබඳව පවත්වන ලද මූලික විභාගයට අනතුරුව සිරගු දැල් මගින් මසුන් ඇල්ලීම සහ යාපනය කලපුවේ භූ ලක්ෂණ හා උප තත්වය යනාදී කරුණු සම්බන්ධයෙන් පර්යේෂණ නිලධාරී, කේ. සච්චිතානන්දන් මහතා ගේ මෙහෙයවීම යටතේ සමීක්ෂණයන් පවත්වන ලදී. මෙම සමීක්ෂණ වල ප්‍රතිපල ලැබුනේ 1971 වර්ෂයේදීය.

පහත දැක්වෙන වාර්තාව පදනම් වී ඇත්තේ කරුණු සැලකිරීම් පිළිබඳව පවත්වනු ලැබූ මූලික විභාගය හා ඉක්බිතිව පවත්වන්නට යෙදුණු සමීක්ෂණ වලින් ලත් තොරතුරු මතයි.

නොයෙකුත් පුද්ගලයන් හා කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද, කරුණු සැලකිරීම් විග්‍රහ කිරීමේදී මෙම යෝජනාවන් පහත සඳහන් පරිදි කොටස් තුනකට බෙදා වෙන්කිරීමට පුලුවන :—

(අ) දැල් සොරකම් කිරීම වැලැක්වීමේ අරමුණ ඇතිව, රෙගුලාසි වල ඒ සඳහා අවශ්‍ය විධිවිධාන ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා ;

(ආ) මසුන් ඇල්ලීමේ අයිතිවාසිකම් විධිමත් කිරීමේ කාර්යය සඳහා රෙගුලාසිවල විධිවිධාන ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා ; සහ

(ඇ) සිරගු දැල් මගින් මසුන් ඇල්ලීම පාලනය කිරීම හා විධිමත් කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා රෙගුලාසිවල විධිවිධාන ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා.

**(අ) දැල් සොරකම් කිරීම වැලැක්වීමේ අරමුණ ඇතිව, අවශ්‍ය විධිවිධාන ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා.—**

ඉදිරිපත් කරන්නට යෙදුණු යෝජනා අතුරින් බොහොමයක්ම ඇතුළත් වූයේ මේ කොටසයි. සිරගු දැල් සොරකම් කිරීමේ සිද්ධීන්

මෙම ධීවරයනට ඔවුන්ගේ එදිනෙදා මසුන් ඇල්ලීමේ කටයුතු මෙන් නිරතුරුව පාහේ මුහුණපෑමට සිදුව ඇති, සැමදටම බලපැවැත්වෙන ප්‍රශ්නයක් බව පෙනී යයි. දැල් සොරකම් කරනු ලැබීමේ සිද්ධීන් නිසා බෙහෙවින් කරදරයට පත්ව සිටින ධීවර කාර්මිකයින් විසින් එක් අතකින් ක්‍රියාත්මක කිරීමට කිසිසේත්ම නොහැකි හා අනෙක් අතට ක්‍රියාත්මක කිරීමෙන් වුවද, ඔවුන්ගේ මසුන් ඇල්ලීමේ කාර්යයන්ට බාධා ඇතිවන හෝ එම කාර්යයන් සීමා කෙරෙන සුළු හෝ යෝජනා ඉදිරිපත් කරන්ට යෙදුණි. පාවිච්චි කරන සිරගු දැල් සංඛ්‍යාව සීග්‍රයෙන් වැඩිවීම හා දැල් සෑදීම සඳහා ගනු ලබන පිට රටින් ගෙන්වන කුරලෝන් දැල් හිඟයක් ඇතිවීම හේතුකොට ගෙන දැල් සොරකම් කිරීම මෑත වර්ෂවලදී බොහෝ සෙයින් වැඩිවී ඇති බව පෙනීයයි. එසේ වුවද, දැල් සංඛ්‍යාව ඉතා අඩුවෙන් පැවති හා දැල් සෑදීම සඳහා මෙරට නිෂ්පාදිත කපු නූල් පාවිච්චි කරමින් පැවති කාලයේදී, එනම් 1929 දී වුවද දැල් සොරකම් කිරීමේ සිද්ධීන් පැවති බව දෙපාර්තමේන්තුවේ ලිපිගොනු වලින් හෙළි වෙයි. මේ අනුව, බලන කල දැල් සොරකම් කිරීම කාලයක් තිස්සේ පැවත එන සිරිතකි. කරුණු මෙසේ හෙයින්, මූලික වශයෙන් මෙම ප්‍රශ්නය විසඳිය යුත්තේ ධීවර කාර්මිකයින්ගේ ගතිපැවතුම්වල වෙනසක් ඇතිකරලීම හා දැල් සොරකම් කිරීමේ යෙදෙන ඔවුන්ගේම සමාජයට අයත් සාමාජිකයනට විරුද්ධව ඔවුන් අතරම පවත්නා සමාජයීය සම්ප්‍රදායයන් මඟින් දඬුවම් පැමිණවීමට උනන්දු කරවීමේ අරමුණ ඇතිව, ධීවරයින්ට මේ සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීමෙන් හා ඔවුන් අතර සෑහෙන ප්‍රචාරයක් ඇති කරලීම මඟිනි. මේ සම්බන්ධයෙන් ගත හැකි තවත් පියවරක් නම් ලංකා ධීවර සංස්ථාව මඟින් අවශ්‍ය දැල් පත්න ප්‍රමාණවත් පරිදි ආනයනය කිරීමට හා ඒවා ධීවරයින් අතර නිසි පරිදි බෙදා හැරීමට කටයුතු යෙදීමයි. දැල් නැතිවීම වැළැක්වීමෙහි ලා රෙගුලාසි මඟින් කළහැකි කාර්යය ඉතා සුළුය. මෙම අරමුණ පෙරදැරි කොට පනවනු ලබන රෙගුලාසි, දැල් සොරකම් කිරීමට බාධා ඇති කෙරෙන්නාවූත් ඒ සමඟම මසුන් ඇල්ලීමේ කටයුතු වලට බාධාවක් හෝ හානි ඇති නොවන්නාවූත් ස්වභාවයේ රෙගුලාසි විය යුතුය. මේ සම්බන්ධයෙන් පහත නිර්දේශකොට ඇති රෙගුලාසි කිසිවක් හෝ දැල් සොරකම් කිරීම වළක්වාලීමට නොහැකි වනු ඇත.

**(අ. 1.) දැල් ලියාපදිංචි කිරීම.**—ඉදිරිපත් කරන්නට යෙදුනු සෑම කරුණු සැලකිරීමකින්ම පාහේ සිරගු දැල් ලියාපදිංචි කළ යුතු බවට යෝජනා කෙරිනි. සුළු කොටසක් කියා සිටියේ, මෙසේ දැල් ලියාපදිංචි කිරීම සිරගු දැල් සමිති මඟින් කළයුතු (පහත අ. 14 ඡේදය) බවයි. එසේ වුවද, දැල් ලියාපදිංචි කිරීම දෙපාර්තමේන්තුව මඟින් කළ යුතු බව වැඩි දෙනෙකුගේ අදහස විය. මෙම යෝජනා වලින් අරමුණු කරන ලද දැ අතර, සිරගු දැල් කෑලි ගණන පෙන්නුම් කෙරෙන පරිදි, එක් එක් කොටසට අඩංගු දැල් කෑලි ගණන ඇස්වල ප්‍රමාණය, ඇස් ගණන අනුව එක් එක් කෑල්ලක දිග හා පළල යනාදිය පිළිබඳ විස්තර සහිත වට්ටෝරුවක් පිළියෙල කිරීමද, ඇතුළත් විය. කළකට ඉහතදී පොලීසියේ අනුග්‍රහය ඇතිව සංවිධානය වී තිබුණු සිරගු දැල් ස්වේච්ඡා සමිති සමාගම් මඟින්ද මේ ආකාරයට දැල් කොටස් ලැයිස්තු ගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන ලදී. මෙහි අදහස වූයේ එක් එක් ධීවර කාර්මිකයාට අයිති දැල් පිළිබඳව සම්පූර්ණ ලැයිස්තු පිළියෙල කොට තිබේනම් සොරකම් කළ අමතර දැල් ළඟ තබාගෙන සිටින තැනැත්තන් අල්ලා ගතහැකි බවයි. සොරකමක් සිදුවී ඇති බවට කෙරෙන පැමිණිල්ලක් ඔප්පු කිරීමට සාක්ෂි වශයෙන්ද ලියාපදිංචිය ආධාරවෙයි. ලියාපදිංචි කිරීමෙන් පසුව, මිළදී ගනු ලබන හෝ විකුණනු ලබන හෝ සෑම දැල් කෑල්ලක් පිළිබඳවම අදාල ලේඛනයේ සඳහන් තැබිය යුතු බවටද, යෝජනා කෙරිනි. ස්වේච්ඡා සමිති සමාගම් මඟින් කරගෙන යන ලද ලියාපදිංචි කිරීමේ වැඩ කටයුතු පැහැදිලිවම පෙනෙන පරිදි, එතරම් සතුටුදායක නොවී ඇති අතර, ඒ අනුව, දෙපාර්තමේන්තුව මඟින්ම ලියාපදිංචි කිරීමේ කාර්යය කළයුතු බවට අදාළ පාර්ශ්වයන් බොහොමයක් විසින්ම ඉල්ලා සිටින ලදී. සිරගුවලෙයි සමිති සමාගමේ ගරු ලේකම් වශයෙන් කළක් කටයුතු කර ඇති, ත්‍රිකුණාමලය, ප්‍රාදේශීය ධීවර පරීක්ෂක ඒ. පිලිප් මහතා මේ පිළිබඳව අදහස් දක්වමින් ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍ර වල අසත්‍ය තොරතුරු සටහන් කිරීමේ සිද්ධීන් පිළිබඳව තමා දන්නා බවද පැවසීය.

(අ. 2) දැල් ලියපාදිංචි කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුව විසින් කළයුතු බවට අදාල පාර්ශ්වයන් බොහොමයක් විසින්ම දැඩි උනන්දුවක් දැක්වූ බැවින්, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මම ඉතා ප්‍රවේශමෙන් සලකා බැලුවෙමි. සිරගුදැල් සමිති විසින් ඉහත දී භාවිතා කරන ලද ආකෘති පත්‍රය අනුව, මෙම කාර්යය සඳහා ආදර්ශ ආකෘති පත්‍රයක්ද කෙටුම්පත් කලෙමි.

(අ. 3) දෙපාර්තමේන්තුව විසින් මෙම දැල් ලියාපදිංචි කිරීම යථා පරිද්දෙන් හා ඵලදායි අයුරින් කරගෙන යාමට නම්, ඒ ඒ ධීවර මධ්‍යස්ථාන වල තිබෙන දැල් එකම දිනයකදී ධීවරයින් ලවා එකම ස්ථානයකට රැස් කරවාගෙන සියළුම දැල් සම්බන්ධයෙන් ඇසින් දැක බලා පරීක්ෂා කිරීම අත්‍යවශ්‍ය වේ. එක් ප්‍රදේශයක් සඳහා ලියාපදිංචි කළ දැලක් වෙනත් ධීවරයෙකුගේ නමින් තවත් ප්‍රදේශයක් සඳහා ලියාපදිංචි නොකිරීමට වගබලා ගනු වස් මෙම කාර්යය එකම දිනයකදී කිරීම අවශ්‍ය වනු ඇත. යාපනය කලපුවේ හා අසල ජලාශයන්හි දළ වශයෙන් දැල් 1,500 ක් පමණ තිබෙන බවද, මෙම ජලාශයන්හි සිරගුදැල් විවිධ වර්ග 7 ක් පාවිච්චි කෙරෙන බවද, කේ. සච්චිතානන්දන් සහ කේ. තේවදාසන් යන මහතුන් විසින් කරනු ලැබූ සමීක්ෂණයකින් හෙලිවී තිබේ. (සිරගුව ලෙයි—ලංකාවේ අක්‍රියාකාරී ධීවර ආම්පන්නයක් ලංකා ධීවර පර්යේෂණායතනයේ ප්‍රවෘත්ති සංග්‍රහය අංක 2, කාණ්ඩය 21) එක් දැලක්, සම්බන්ධ කොටස් ගණනාවකින් සමන්විතය. මාදැල (වේලි), පැතිදැල් (සිරගු) එකක් හෝ කට්ටලයක්, කොටු (chambers), (පෙරුක්කුඩ සහ පඩ්ඩි) මේවා 2-4 ක් යනාදී වශයෙනි. කොටස් සියල්ලක්ම විවිධ ප්‍රමාණයෙන් යුත් ඒවා වන අතර, විවිධ ප්‍රමාණ වල දැල් ඇස් වලින් සාදා ඇත. මේ අනුව, බලනකල යාපනය කොට්ඨාශයේ නියුතු සියළුම ක්ෂෙත්‍ර නිලධාරීන් තනිකරම මෙම කාර්යය උදෙසා යෙදවීමෙන් වුවද, යෝජනා කර ඇති අයුරින් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා සියළුම සිරගු දැල් පිළිබඳව නිසි පරිදි සම්පූර්ණ සෝදිසියක් සතියකින්වත් කළහැකි වේදැයි අනුමාන සහිතය. නිශ්චිත වශයෙන්ම මෙම සෝදිසිය එක් දිනකදී කළ නොහැකිය. එබැවින් මේ ආකාරයට ලියාපදිංචි කිරීම ක්‍රියාත්මක කළ හැකි කාර්යයක් නො වන්නේය.

(අ. 4) මලිච්චි වීඩු වරායෙහි සහ අරියාලෙයි වරායෙහි කොටසක පමණක් සිරගු දැල් ලියාපදිංචි කිරීම සඳහා දැනට බල පැවැත්වෙන රෙගුලාසි වල 25 (1) —(6) වැනි වගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇත. රෙගුලාසි වල උපලේඛනයෙහි ලියාපදිංචි කිරීමේ සහතිකයක් සඳහා භාවිතා කිරීම පිණිස ආකෘති පත්‍රයක් දක්වා ඇත. සාර්ථක ප්‍රතිඵල ලැබෙන අයුරින් ලියාපදිංචි කිරීමේ කාර්යය විස්තරාත්මක ලෙස කරගෙන යාම කොහෙත්ම ක්‍රියාත්මක කළ නොහැකි දෙයක් වන බැවින්, කිනම් ආකාරයකින් හෝ ලියාපදිංචි කිරීම කරගෙන යාම නිෂ්ඵල කාර්යයක් වියහැකි බව මාගේ අදහසයි. දැනට බලපැවැත්වෙන රෙගුලාසි වලින් අරමුණු කෙරෙන පරිදි, ලියාපදිංචි කිරීමෙන් ඇති වන ප්‍රතිඵලය නම්, කිසිම ප්‍රයෝජනවත් කාර්යයක් ඉටු නොවන ලිඛිතමය වැඩ කටයුතු සෑහෙන ප්‍රමාණයක් ඇතිවීම හා ධීවර කාර්මිකයිනට බලවත් දුෂ්කරතාවයන්ට හා අපහසුකම් වලට මුහුණු පෑමට සැලැස්වීම පමණි. ගණන් ගැනීමේ කාර්යයන් සඳහා තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථා වලදී ලියාපදිංචි කිරීමේ වාර්තාවන් පිළිබඳව බලාපොරොත්තු නො තබා විශේෂ වශයෙන්ම අවශ්‍ය තොරතුරු රැස්කර ගතහැකි අතර, පවත්වනු ලැබූ ශිල්පීය සමීක්ෂණයෙහිදීද මේ බව හෙලිවුනි.

එබැවින්, දැල් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ඇති විධිවිධානයන් (කෙසේ වුවත් මේවා කවර කලකදීවත් ක්‍රියාත්මක කර නැත.) ඉවත් කළයුතු යැයි නිර්දේශ කරමි.

**දැල් ලකුණු කිරීම.**—(අ. 5) දැල් ලකුණු කිරීමේ එක් ක්‍රමයක් පිළිබඳව දැනට බලපැවැත්වෙන රෙගුලාසි වල 5(5) වැනි වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇත. මේ ක්‍රමය නම්, ලියාපදිංචි අංකය ලකුණු කර ඇති අඟල් 2 හතරැස් ලී කැබෙල්ලක් දැලේ කොටසකට සවි කිරීමයි. මේ අයුරින් ලකුණු කිරීම දැල් සොරකම් කිරීම වැළැක්වීමට තුඩු දෙන ක්‍රමයක් ලෙසින් ප්‍රයෝජනවත් නොවනු ඇති අතර, රාජකාරී කටයුතු සඳහා දැල් හඳුනා ගැනීමේ කාර්යයන් සම්බන්ධයෙන් වුවද එය එතරම් දුරට ප්‍රමාණවත් නොවේ. කලකට ඉහතදී දැල් සොරකම් කිරීම උග්‍ර ලෙසින් පැවති අවධියේදී සමහර සිරගු දැල්වල ධීවරයෝ ඔවුන්ගේ නම් පින්තාරු කිරීමේ සිරිතට පුරුදුව සිටියහ. වැඩි වශයෙන්ම මෙසේ නම් පින්තාරු කරන ලද්දේ තෙල් සායමිනි. සොරකම් කළ දැල් හඳුනාගැනීම සඳහා මෙම ක්‍රමය සෑහෙන තරමකට ප්‍රයෝජනවත් වූ බවත්, මෙසේ සායම් කළ ලකුණු සෑහෙන කාලයක් නොමැකී පැවති බවත්, පක්ෂ කිහිපයක් විසින්ම ප්‍රකාශ කරන ලදී. දැල් සොරකම් කිරීම වැළැක්වීමේ පියවරක් වශයෙන් මේ අයුරින් දැල් ලකුණු කිරීම, ලියාපදිංචි කිරීමට වඩා සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන ක්‍රමයක් වනු ඇතැයි මගේ අදහසයි. මෙසේ පින්තාරු කරන ලකුණු ඉවත් කිරීම සඳහා දැල් සොරකම් කරන්නෙකුට බොහෝ වේලාවක් ගතවනවාත් සමග ඒ සඳහා සෑහෙන ප්‍රයත්නයක් දැරීමටද, සිදුවේ. දැල් වලට හානි සිදුවීමට ඉඩ ඇති බැවින්, මේ සඳහා විෂ සහිත රසායන ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන්ද ඔවුන් වැලකෙනු ඇත. එබැවින්, සිරගු දැලක් සාදා ඇති සෑම දැල් කොටසකම අයිතිකරුගේ නම සායම් වර්ගයකින් ලකුණු කිරීම අවශ්‍ය කෙරෙන විධානයක් රෙගුලාසි වලට ඇතුලත් කළ යුතු යැයි නිර්දේශ කරනු ලැබේ. ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම පිළිබඳ රෙගුලාසි වල දැක්වෙන පරිදි, ධීවර යාත්‍රාව වල රුවලෙහි ලියාපදිංචි කළ අංකය ලකුණු කිරීම සඳහා යෙදිය යුතු බවට නියම කර ඇති ප්‍රමාණයේ අකුරු මෙන් මේ සඳහාද පහසු අන්දමට යම් ප්‍රමාණයක අකුරු භාවිතා කළ හැකිය.

**ඒ ඒ ගම් සඳහා නිශ්චිත වශයෙන් දැල්වල ඇස් ප්‍රමාණය හෝ පාට වර්ග නියම කිරීම:** (අ. 6) ගම් පහක ධීවරයින් විසින් විවිධ මිණුම් ප්‍රමාණ වලින් යුත් දැල් පට් පාවිච්චි කළයුතු බවට දැනට බල පැවැත්වෙන රෙගුලාසි වල 5(3) වැනි වගන්තියෙන් නියම කෙරේ. මුලින්ම 1954 දී මෙම රෙගුලාසිය ඇතුළත් කරන ලද්දේ ගමින් ගමට දැල් සොරකම් කිරීම වැළැක්වීමේ පියවරක් වශයෙනි. දැල් සියල්ලක්ම කපු නූලෙන් සෑදූ මෙරට දැල් වශයෙන් පැවති කාලයකදී මේ ආකාරයේ රෙගුලාසියක් පැනවිය හැකිව තිබුණි. එහෙත් සම්මත ප්‍රමාණයේ ඇස් වලින් යුත් ආනයනය කළ කුරලෝන් දැල් පාවිච්චි කරනු ලබන මෙවැනි කාලයකදී තවදුරටත් අදාල නොවේ. මෙම රෙගුලාසිය මේ කාලයට නොගැලපෙන්නක්

බවත්, එබැවින් එය ඉවත් කළ යුතු බවත්, පක්ෂ කිහිපයක් විසින්ම පෙන්වා දෙන ලදී. එය ඉවත් කළ යුතු බව මමද පිළි ගනිමි.

(අ.7) මෙම රෙගුලාසිය වෙනුවට, එක් එක් ගමක පාවිච්චි කරනු ලබන දැල් වලට වෙනම පාටක් තිබිය යුතු බවට නියම කෙරෙන වෙනත් රෙගුලාසියක් පැනවිය යුතුයයි පක්ෂ බොහොමයක්ම කියා සිටියහ. මෙම ක්‍රමය ඉහතදී ස්වේච්ඡා සිරගු දැල් සමිති මගින් ක්‍රියාත්මක කර ඇති බවත්, ඒ කාලයේදී දැඩි පියවරක් වශයෙන් මෙය සෑහෙන දුරට සාර්ථකවූ බවත් හෙලි විය. මෙම යෝජනාව පිළිබඳව තිබූ ජනප්‍රියතාවය අනුව, මේ ගැන ඉතා සැලකිල්ලෙන් සලකා බලන ලදී. නමුත් එය ක්‍රියාත්මක කිරීමට එරෙහිව බාධක ගණනාවක්ම ඇති බව පැහැදිලි විය. හානියක් නොවන අයුරින් දැල් වල සායම් ඉවත් කළ හැකි බව පර්යේෂණ නිලධාරි සච්චිතානන්දන් මහතා විසින් කරන ලද, පරීක්ෂණ වලින් හෙලිවූ අතර, මෙසේ ඉවත් කිරීමෙන් පසුව වුවද, දැල් වල ගැටයක් කැපීමෙන් එහි මුලින් තිබූ පාට සොයා ගත හැකි යයි සමහර ධීවරයින් විසින් කරන්නට යෙදුණු ප්‍රකාශය වැරදි බවද, පෙනී ගියේය. මේ සඳහා පාවිච්චි කිරීමට අවශ්‍ය තරම් මූලික පාට වර්ගද නොමැත. සුදුපාට මේ සඳහා පාවිච්චි කිරීමට නොහැකි අතර, රතු සහ දුඹුරු පාට (කඩොල් පොතු වල පාටට හුරු හෙයින්) පාවිච්චි කිරීම ගැනද, සමහර ධීවරයෝ විරෝධය පළ කළහ. අනෙක් අතට සරගු දැල් පාවිච්චි කරන ගම් 7 කටත් වැඩියෙන් ඇත. මේ පිළිබඳව තවදුරටත් සලකා බලන කල දැල් පාට කිරීම වුවද, ඇත්ත වශයෙන්ම කිසියම් ගමක් ඇතුළත එම දැල් සොරකම් කිරීම වැළැක්වීමේ පියවරක් වශයෙන් ප්‍රයෝජනයක් ගෙන නොදෙනු ඇත. එක් එක් ගමට පාට වෙන් කරදීම සම්බන්ධයෙන්ද අපහසුකම් ඇතිවීමට පිළිවන.

(අ.8) කරුණු මෙසේ හෙයින්, ඒ ඒ ගම් සඳහා විශේෂ පාට වර්ග වෙන්කර දීම සම්බන්ධයෙන් නීතිමය විධානයක් පැනවිය යුතුයැයි මම නිර්දේශ නො කරමි. දැල් සොරකම් කිරීම වැළැක්වීමේ පියවරක් වශයෙන් දැල් ලකුණු කිරීම (ඉහත (අ. 5) ඡේදය අනුව) වඩාත් ඵලදායි ක්‍රමයක් වනු ඇති අතර, දැල් පාට කිරීමේ ක්‍රමයක පවත්නා අවාසි වලින්ද තොරය.

(අ. 9) ඒ ඒ ගම් සඳහා විවිධ දැල් ඇස් ප්‍රමාණයන් නියම කළ යුතු බවටද පක්ෂ කිහිපයක් විසින් යෝජනා කරන ලදී. මෙය ක්‍රියාත්මක කළ නොහැකිය. ධීවරයින් විසින් මිමී. 11-15 දක්වා වූ වෙනස් වෙනස් ප්‍රමාණවල දැල් ඇස් පාවිච්චි කරනු ලබන බවද, දැල් සාදා ඇති විවිධ කොටස් සඳහා ගනු ලබන ඇස් වල ප්‍රමාණයන් වුවද, වෙනස් බවද, සච්චිතානන්දන් සහ තේවදාසන් යන මහත්වරුන් විසින් කරන ලද, සමීක්ෂණයෙන් පෙන්නුම් කෙරේ.

(අ. 10) **දැල් එහා මෙහා ගෙනයාම පිළිබඳ සීමා කිරීම්.**—දැල් සොරකම් කිරීම් සිදු වන්නේ රාත්‍රි කාලයේදී බැවින්, පක්ෂ ගණනාවක් විසින් පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කරන ලදී :—

(අ) ප.ව. 6 සිට පෙ. ව. 3 දක්වා කාලය තුළ සිරගු දැල් ප්‍රවාහනය කිරීම තහනම් කළ යුතුය..

(ආ) ප. ව. 6 සිට පෙ. ව. 3 දක්වා කාලය තුළ කලපුවතුල මසුන් ඇල්ලීම හෝ එහා මෙහා යාම හෝ තහනම් කළ යුතුය.

(ඇ) සිරගු දැලක් වාහනයක රැගෙන යාමට සිදුවන සෑම අවස්ථාවකදීම ඒ සඳහා දෙපාර්තුමේන්තුවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු බවට විධිවිධාන සැලසීම.

(අ. 11) ඉහත (ආ) යටතේ දැක්වෙන පරිදි, තහනමක් පැනවීම ක්‍රියාත්මක කිරීමට අපහසු වනු පමණක් නොව, සිරගුවලෙහි හැර වෙනත් පන්න ක්‍රම මගින් කරනු ලබන මසුන් ඇල්ලීමේ කටයුතු වලටද බාධකයක් වනු ඇත. ධීවරයෙකු නොමැතිව ධීවර පන්නය මගින්ම මසුන් ඇල්ලීම කෙරෙන සිරගු දැල මෙන් නොව ධීවරයින් විසින්ම ක්‍රියාවේ යෙදවිය යුතු වෙනත් පන්න ක්‍රම ගණනාවක් මගින්ම රාත්‍රි කාලයේදී මසුන් ඇල්ලීම කරනු ලැබේ. මේ අයුරින් තහනමක් පැනවුවහොත් තම තමන්ගේ දැල් පන්න ආරක්ෂා කිරීම සඳහා රාත්‍රී කාලයේදී ඒ පිළිබඳව සෝදිසියෙන් සිටින ධීවරයින් ද එයින් වළක්වා ලනු ඇත.

(අ. 12) ඉහත (ඇ) මගින් කර ඇති යෝජනාව ක්‍රියාත්මක කිරීම හේතුකොටගෙන ධීවරයිනටම කරදර සිදුවිය හැකිය. තමන්ගේ ගම් වලින් ඉතා දුර බැහැර ප්‍රදේශ වල දැල් අටවන ධීවරයින් එම දැල් වාහන වල ගෙන යන බැවින්, ඔවුනට බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවන්හිදී ඒ සඳහා ධීවර නිලධාරීන් හමුවීමට නොහැකි වීමට ඉඩ තිබේ.

(අ.13) කෙසේ වුවත් ඉහත (අ) යටතේ ඇති යෝජනාව නිර්දේශ කළ හැකිය. ඇත්ත වශයෙන්ම දැල් සොරකම් මැඩ පැවැත්වීමේ පියවරක් ලෙසින් පොලීසිය විසින් පාලනමය කාර්යයක් වශයෙන් මෙබඳු නීතියක් ක්‍රියාත්මක කෙරෙමින් තිබී ඇත. සිරගු දැල් දහවල් කාලයේදී ඇටවිය යුතු අතර සාමාන්‍යයෙන් එය, ප. ව. 6.00 ට පෙර කරනු ලැබේ. රාත්‍රිකාලයේදී එම දැල් ඉවත්කර ගැනීමට කිසිම හේතුවක් නැත. එබැවින්, රාත්‍රි කාලයේදී ප්‍රවාහනය කෙරෙන සිරගුවලෙයි දැලක් වේනම්, එය සොරකම් කරන ලද දැලක් වීමට ඉඩ තිබේ. ප.ව. 6 සිට පෙ.ව. 6 දක්වා කාලය තුලදී කිසිම වාහනයක හෝ යාත්‍රාවක හෝ සිරගු දැලක් ප්‍රවාහනය කිරීම වරදක් බවට නියම් කෙරෙන විධිවිධානයක් රෙගුලාසි වලට ඇතුළත් කළ යුතුය.

(අ. 14) **සිරගු දැල් සමිති පිහිටුවීම.**—එක් එක් ගමක සිරගුවලෙහි දැල් පන්නය කරන ධීවරයින් සඳහා සිරගු දැල් සමිති හෝ සෑම ගමක් හෝ සාම මණ්ඩල ප්‍රදේශයක් සඳහා අනිවාර්යයෙන්ම පිහිටුවන සිරගුදැල් සමූපකාර සමිති යනාදි වශයෙන් හෝ සිරගු දැල් ධීවර කාර්මිකයන් අතර, කිසියම් ආකාරයක සංගමයක් පිහිටුවීම සඳහා රෙගුලාසි වල විධිවිධාන ඇතුළත් කිරීම සම්බන්ධයෙන් කරුණු සැල කිරීම් ගණනාවක්ම ඉදිරිපත් කෙරිණි. මෙම සමිති, රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේලා දෙපාර්තමේන්තුවට සහාය වන උපදේශක මණ්ඩල ස්වරූපයෙන් යුක්ත විය යුතු බව සමහර දෙනෙකුගේ අදහස වූ අතර, දැල් ලියා පදිංචි කිරීම ආදී කාර්යවලට අමතරව සොරකම් පිළිබඳ සිද්ධීන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සෝදිසි කිරීමේ හා දඩ නියම කිරීමේ බලතල යනාදි වශයෙන් දඬුවම් පැමිණවීමේ හා අර්ධ අධිකරණ ස්වභාවයේ බලතල ඇතුළත් අර්ථ නිරූපිත බලතල මෙම සමිතිවලට තිබිය යුතු බව අනෙක් අයගේ අදහස විය.

(අ. 15) මෙහිදීද, මෙම යෝජනාවන් පිළිබඳව වැඩි උනන්දුවක් දක්වන ලද්දේ, දැල් සොරකම් කිරීම මැඩ පැවැත්වීම සඳහා කලකට ඉහතදී සංවිධානය කරනු ලැබූ ස්වේච්ඡා සංගම් මගිනි. සමහර විට නීතිමය බලතල ලබා දෙන මෙන් ඔවුන් විසින් ඉල්ලා සිටින ලද්දේ, බොහෝ වතාවලදීම මෙම සංගම් වලට ඒවායෙහි කාර්යයන් ඵලදායි අයුරින් ඉටු කර ගැනීමට නොහැකිවීම නිසා විය හැකිය.

(අ. 16) නිශ්චිත බලතල ලබාදිය නොහැකි නම් මෙබඳු සංගම් නීති ගත කිරීමෙන් ප්‍රයෝජනයක් නොලැබෙනු ඇත. අනෙක් අතට බලන කල ඵලදායි අයුරින් කටයුතු කිරීම සඳහා මෙම සමිති වලට අවශ්‍ය විය හැකි ආකාරයේ බලතල ලබා දීමට වුවද, නීතියෙන් ඉඩක් නොමැති වනු ඇත. මෙබඳු සමිති වලින් සැලසෙන්නාවූ එකම ප්‍රයෝජනය, රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ධීවරයින්ගේ ආධාරයත්, සහයෝගයත් ලබා ගැනීම වනු ඇත. ඔවුන්ගේ ප්‍රදේශ වල පිහිටුවා ඇති, විශාල ප්‍රාථමික ධීවර සමූපකාර සමිති වල සාමාජිකත්වය ලබා ගැනීමට සිරගුදැල් ධීවරයින් උනන්දු කරවුවහොත්, ඒ මගින් වුවද, එම කාර්යය ඉටු කර ගත හැකි වන අතර, මේ සඳහා තවත් ආකාරයක සංවිධානයක් පිහිටුවීම අවශ්‍ය නොවනු ඇත. එබැවින්, එබඳු සංවිධානයන් සඳහා නීතිමය විධිවිධාන නොයෙදිය යුතු යයි නිර්දේශ කරන අතර, ඒ වෙනුවට හැකි පමණින් සිරගු දැල් ධීවරයින් වැඩිම සංඛ්‍යාවක් සාමාජිකයින් වශයෙන් බඳවා ගැනීම සඳහා අදාල ප්‍රදේශවල විශාල ප්‍රාථමික ධීවර සමූපකාර සමිති මගින් සාමාජිකයින් බඳවා ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන මෙන් නිර්දේශ කරනු ලැබේ.

(අ. 17) **කලපුවේ දී ධීවර යාත්‍රාවල "පැට්‍රල්මැක්ස්" ලාම්පු පාවිච්චිය තහනම් කිරීම.** කලපුවේ බෝට්ටුවල සිට "පැට්‍රල්මැක්ස්" ලාම්පු පාවිච්චි කිරීම ගැන එක් පක්ෂයක් විසින් විරෝධය පළ කරන ලදී. ඒ සඳහා ඉදිරිපත් කළ හේතු දෙකකි. එක් හේතුවක් නම්, මෙම ලාම්පු එළියේ ආකර්ෂණය නිසා, සිරගු වලෙයි දැල් වලට අසුවී සිටින මසුන් ඒවායෙන් ගැලවී පැනයාමට හේතු වන බවයි. අනික් කාරණය නම්, ලාම්පුවේ එළිය විහිදෙන දුර ප්‍රමාණයට එපිට ප්‍රදේශය අඳුරු වීම නිසා දැල් සහ මාළු සොරුන්ට මේ ලාම්පු මගින් ආවරණයක් සැලසෙන බවයි. මෙම මතවල යම් සත්‍යයක් ඇති බව පෙනී යයි. යාත්‍රා කිරීම සඳහා දැඩි රශ්මියෙන් යුත් ලාම්පු පාවිච්චි කිරීම අවශ්‍ය නැති අතර, ලාම්පු වලින් විහිදෙන ආලෝකය කරා මසුන් (ඉස්සන් වැනි මත්ස්‍ය වර්ග) ඇදී ඒම සම්බන්ධයෙන් සලකා බලන කල සාමාන්‍ය ලාම්පු හෝ හුළු එළි පාවිච්චි කිරීම සෑහෙනු ඇත. දැඩි රශ්මියෙන් යුත් ලාම්පු පාවිච්චි කරන පුද්ගලයිනට සාමාන්‍ය එළි පාවිච්චි කරන ධීවරයින් විශාල සංඛ්‍යාවකට වැඩියෙන් අසාධාරණ අයුරින් ලැබෙන වාසියක්ද වෙයි. එබැවින් කලපුව තුළ එබඳු ලාම්පු පාවිච්චි කිරීම තහනම් කළ යුතුය. විදුලි ආලෝකය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මෙම තහනම් අදාල නොවිය යුතුය.

(අ. 18) **අයිතිය සීමා කිරීම.**—ධීවරයෙකුට එක්දැලකට වඩා දැල් සංඛ්‍යාවක් හිමිකර ගැනීමට ඉඩ තිබීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දැල් සොරකම් සිදුවන බව එක් පක්ෂයක අදහස විය. මෙම තර්කය එතරම් පැහැදිලි නොවූ නමුත් එයින් අදහස් කරන ලද්දේ එක් දැලකට වැඩියෙන් දැල් සංඛ්‍යාවක් යම් අයෙකුට අයිතිව තිබේ නම් ඒ අමතර දැල් සොරකම් කිරීමෙන් තමන් සතුකර ගත් දැල (සොරකම් කිරීමෙන් තමන් සතු කරගත් දැල්) විය යුතු බවයි. අනුමාන කළහැකි බවයි. සෑම වැඩිහිටි අයෙකුටම එක් දැලක් පමණක් පාවිච්චි කිරීමට ඉඩ දිය යුතු බවද තවදුරටත් සීමාකිරීමක් වශයෙන් සෑම සිරගු දැල් හිමියෙකුටම වල්ලමක් තිබිය යුතු බවට නීතියක් පැනවිය යුතු බවද මේ සම්බන්ධයෙන් විසඳුමක් වශයෙන් යෝජනා කෙරිණි. එක් දැලකට වැඩියෙන් දැල් සංඛ්‍යාවක් තිබෙන ධීවරයින් විසින් සොරකම් කිරීමෙන් ඔවුන්ගේ ඒ අමතර දැල් අත්පත් කර

ගෙන ඇතැයි යන මතය පිළිගත හැකියයි මම නොසිතමි. මෙය කවරකු විසින් හෝ පළ කරන්නට යෙදුණු අදහස් ප්‍රකාශයක් පමණි. අමතර දැල් එකක් හෝ වැඩි ගණනක් මිළදී ගැනීම ඇත්ත වශයෙන්ම ධීවර කර්මාන්තය සඳහා කරනු ලබන ආයෝජනයක් වන අතර, තමන්ගේ රැකියාව වෙනුවෙන් තවදුරටත් මුදල් ආයෝජනය කිරීමෙන් කිසියම් ධීවර කාර්මිකයෙකු අධෛර්යයට පත් නොකළ යුතු බව මගේ හැඟීමයි. තවද, මේ අයුරින් දැල් සංඛ්‍යාව සීමා කිරීමට නැත් කලහොත් එසේ ක්‍රියාත්මක කිරීමේදී ධීවරයින් විසින් ඔවුන්ගේ පවුල් වල අනිකුත් සාමාජිකයින්ගේ හෝ නෑදෑයින්ගේ හෝ නම් වලින් දැල් ලියාපදිංචි කිරීමෙන් එබඳු ක්‍රියා මාර්ගයක් නිරායාසයෙන්ම අහෝසිවී යනු ඇත. අනෙක් අතට එක් එක් දැල සඳහා වල්ලමක් බැගින් තිබීමද අවශ්‍ය නොවේ. වල්ලමක් අවශ්‍ය වන්නේ ඇටවීම සඳහා පාඩුවකට දැල් ගෙනයාමට හා අනාතුරුව උදෑසන පැමිණ අසුවී සිටින මසුන් ගෙන යාමට පමණි. දැල් කිහිපයක් සඳහා එක යාත්‍රාවක් පාවිච්චි කිරීමෙන් වියහියදම් අඩුකර ගැනීමට ධීවරයින් කැමැත්තක් දක්වන්නේ නම් එබඳු ක්‍රියාවක් වැළැක්විය යුතු නොවේ. එබැවින්, යෝජනා කර ඇති අයුරින් සීමා කිරීමක් පැනවීම මම නිර්දේශ නො කරමි.

(ආ) **මසුන් ඇල්ලීමේ අයිතිවාසිකම් විධිමත් කිරීමේ කාර්යය සඳහා රෙගුලාසිවල විධිවිධාන ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා.**—මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්නට යෙදුනේ, යෝජනා කිහිපයක් පමණි. ප්‍රධාන වශයෙන් එම යෝජනා කරුණු දෙකකට අදාල විය. එනම් ඒ ඒ ගම් සඳහා මසුන් ඇල්ලීමේ ප්‍රදේශ මායිම් කොට බෙදා දක්වීම හා "හොඳ" පාඩු එනම්, නිරතුරුවම බෙහෙවින් මසුන් අසුවන පාඩු සමසේ ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් පියවර ගැනීමයි.

**මසුන් ඇල්ලීමේ ප්‍රදේශ මායිම් කොට බෙදා දැක්වීම.**—(ආ. 1) පදිංචි ස්ථාන වලට තුදුරින් හෝ යාබදව හෝ පිහිටි ජලාශයන් තනිකරම තමන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්වී ඇතැයි සැලකීම දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ ධීවරයින්ගේ පොදු හැඟීමකි. ධීවරයින් මෙවැනි මතයක එල්බ ගෙන සිටීම හේතුකොට ගෙන ධීවර ආරවුල් ගණනාවක්ම හටගෙන ඇත. මෙය දිවයිනේ බලපැවැත්වෙන්නාවූ පොදු නීතියටද, ලංකාව සතු ජලාශයන් හා ඒවායෙහිධීවර සම්පත් සෑම පුරවැසියෙකුටම සමාන අයිතිවාසිකම් හිමි වන්නාවූ පොදු සම්පතක් බවට පිළිගැනෙන මූල ධර්මයටද පටහැනි වෙයි. ධීවර ආරවුල් සාධාරණ අයුරින් බේරුම් කිරීමේ ක්‍රියා මාර්ගයක් වශයෙන් ධීවර ආඥාපනත යටතේ පනවා ඇති රෙගුලාසි මගින් සමහර ප්‍රදේශ වල ධීවරයින්ට පූර්ණ අයිතිවාසිකම් ලබාදී ඇත. එසේ වුවද එබඳු අයිතිවාසිකම් ලබා දීම, සෑම විටම පිළිපැදිය යුතු ක්‍රියා මාර්ගයක් නොවේ. සිරගු දැල් මගින් මසුන් ඇල්ලීම කෙරෙන ජලාශයන් සම්බන්ධයෙන් ඒ ඒ ගම් අතර, මෙම ජලාශයන් මායිම් කොට බෙදා දැක්වීම අවශ්‍යයැයි සැලකීමට තරම් හේතු වන තත්ත්වයක් එළඹී නැත. එබැවින් එබඳු මායිම් කිරීමක් සඳහා කිසියම් විධානයක් ඇතුළත් කළයුතු යැයි මම නිර්දේශ නොකරමි.

**පාඩු දැල් අටවන ස්ථාන පිළිබඳ ප්‍රශ්නය.**—(ආ. 2) සිරගු දැල් මගින් මසුන් ඇල්ලීමේදී පාඩුවක් යනුවෙන් අදහස් කෙරෙන්නේ සිරගු දැලක් ක්‍රියාවේ යොදවනු ලබන ප්‍රදේශයයි. බෙහෙවින් මසුන් අසු වන හොඳ පාඩුවල දිගටම මසුන් ඇල්ලීමට එකම පුද්ගලයින් පෙළඹෙන අතර, ඔව්හු වෙනත් ධීවරයින්ටද එම පාඩුවල මසුන් ඇල්ලීමට ඉඩ ලැබෙන පරිදි, ඒවායින් ඉවත්නොවී ඒ පිළිබඳ ඒකාධිකාරය හිමිකර ගනිති.

මෙම ප්‍රශ්නය විසඳීම සඳහා කරුණු සැලකිරීම් වලින් යෝජනා දෙකක් ඉදිරිපත් කෙරිණි.

(අ) සියලුම සිරගු දැල් පාඩුවල මසුන් ඇල්ලීම සඳහා සෑම දින 14 කට වරක් බැගින් හෝ මසකට වරක් බැගින් හෝ වනසේ වාර වෙන් කිරීම සඳහා රෙගුලාසි වල විධානයක් ඇතුළත් කිරීම ;

(ආ) ධීවරයෙකුට ඕනෑම දැල් පාඩුවකට හිමිකම් ලබා ගත හැකි පැරණි සිරිත නීතිගත කිරීම සඳහා රෙගුලාසි වල විධානයක් ඇතුළත් කිරීම.

(ආ. 3) ඉහත (අ) සම්බන්ධයෙන් මාදැල් පාඩු වාර වෙන් කිරීම දිවයිනේ බොහෝ ප්‍රදේශයන්හි කෙරෙන තරමක් දුරට පොදු ක්‍රියා පිළිවෙලකි. ධීවර ආඥාපනත යටතේ පනවා ඇති සමහර රෙගුලාසි මගින් මාදැල් පාඩු වාර වෙන් කිරීම සඳහා නීතිමය විධානයක්ද පනවා ඇත. කෙසේ වෙතත් එබඳු සිද්ධීන් සම්බන්ධයෙන් පාඩු සංඛ්‍යාව ඉතා සුළු ගණනක් වන අතර, රෙගුලාසි වල කාර්යයන් සඳහා වාර වෙන් කිරීමේ කාල සටහනක් පිළියෙල කිරීම පහසු දෙයකි. එපමණක් නොව, මාදැල් පාඩු සම්බන්ධයෙන් වෙරළබඩ මුහුදේ පාඩු පිහිටා ඇති ස්ථානයන් පහසුවෙන් හඳුනා ගැනීමටද හැකිය. සිරගු දැල් පාඩු සම්බන්ධයෙන් බලන කල දැල් පාඩු විශාල සංඛ්‍යාවක්/ තිබීම හා ඒවා කිසියම් ක්‍රමයකට අනුව නොව මසුන් අල්ලන ප්‍රදේශයෙහි සෑම තැනෙකම පාහේ විසිරී තිබීම හේතු කොට ගෙන රෙගුලාසිවල මේ සම්බන්ධයෙන් වාර වෙන් කිරීමේ ක්‍රමයක් ඇති කිරීම ක්‍රියාත්මක කළ නොහැකිය. රෙගුලාසි වලට ඇතුළත් කළ හැකි වුවද, එබඳු රෙගුලාසියක් ක්‍රියාවේ යෙදවීම පරීක්ෂා කිරීමද කළ නොහැකි දෙයක් වනු ඇත. යාපනය කලපු ප්‍රදේශය පමණක් වර්ග සැතපුම් 160 කින් සමන්විත බවද, යටත් පිරිසෙයින් එයින් වර්ග සැතපුම් 71 ක් පමණ ප්‍රදේශයක සිරගු දැල් විශාල සංඛ්‍යාවක් ඒකරාශිව ඇති බවද සැලකිල්ලට භාජනය කිරීමෙන් මෙම ප්‍රශ්නයේහි බරවතලකම අවබෝධකරගත හැකිය. (යාපනය කලපුවේ භූ ලක්ෂණ හා උපතට්ටුව—කේ. සච්චිතානන්දන් සහ ඩබ්ලිව්. කේ. ටී. පෙරේරා ; ලංකා ධීවර පර්යේෂණායතනයේ ප්‍රවෘත්ති සංග්‍රහය අංක 2, 21 වැනි කාණ්ඩය අනුවයි).

(ආ. 4) ඉහත (ආ) සම්බන්ධයෙන්, මෙම යෝජනාව ඉදිරිපත් කරන ලද පක්ෂ විසින් සඳහන් කරන ලද්දේ, ඉහත කාලයේදී අනුගමනය කළාවූ එහෙත් තවදුරටත් භාවිතා නොකෙරෙන පැරණි සිරිතක් පිළිබඳවය. මෙම සිරිතට අනුව, යම් පාඩුවක් දැල් ඇටවීමට බලාපොරොත්තු වන ධීවරයෙකු විසින්, වෙනත් අයකු විසින් ඒ වන විටත් දැලක් අටවනු ලැබ ඇති එම පාඩුව ඉදිරිපිට දින 15 ක් ඇතුළත ඕනෑම දිනයකදී ඉන්නක් හිටවීමෙන් එම පාඩුවට හිමිකම් දැක්විය හැකිය. මෙසේ හිමිකම් දැක්වූ තැනැත්තා විසින් වෙනත් තැනෙක අටවා ඇති තමන්ගේ දැල එතනින් ඉවත් කොට හිමිකම් ඉල්ලා සිටින පාඩුව ඉදිරිපිටම ගෙනවුත් දින 15 ගතවීමෙන් පසුව, එම පාඩුවෙහි දැල් අටවා ගෙන සිටින තැනැත්තා විසින් එම දැල ඉවත් කර ගන්නා තුරු එය පසෙකින් තැබිය යුතුය. රෙගුලාසි වල නිශ්චිත වශයෙන්ම අන්තර්ගත කිරීමෙන් මෙම චාරිත්‍රය නීතිගත කළයුතු යැයි යෝජනා කරන ලදී. එබඳු රෙගුලාසියක් අදාල විය යුත්තේ මසුන් බහුල "හොඳ" පාඩු වශයෙන් ගැනෙන ස්ථාන සීමිත සංඛ්‍යාවකට පමණකැයිද එම පාඩු වලට නම් ඇති බවද, ගොඩබිම සළකුණු හෝ තරු සළකුණු මගින් ඒවා හඳුනා ගත හැකි බවද, එකී පක්ෂ විසින් ප්‍රකාශ කරන්නට යෙදුණි.

(ආ. 5) මෙහිදීද එබඳු ක්‍රමයක් රෙගුලාසි වලට අන්තර්ගත කිරීම අසීරු කාර්යයක් වනු ඇත. එයට හේතුව නම්, රෙගුලාසියක නිශ්චිත වශයෙන් දැක්වීමට තරම් සියුම් ආකාරයකින් එම පාඩු පිහිටා ඇති ස්ථාන පිළිබඳව අර්ථ නිරූපණය කිරීමට ඇති දුෂ්කර තාවයයි. ඉන්නක් සිටවීමෙන් පමණක් අයිතියක් ලබා ගැනීමට හිමිකම් දැක්වීමටද, රෙගුලාසියක කාර්යයන් සඳහා ප්‍රමාණවත් නොවනු ඇත. හිමිකම් දැක්වීමක් නිල වශයෙන් ලිඛිතව තිබීම අවශ්‍ය වනු ඇත. මෙම ක්‍රමය පදනම්වී ඇති මූල ධර්මය හොඳ බව නිසැකයෙන්ම පිළිගැනෙන නමුදු යෝජනා කරනු ලැබූ අයුරින් ඒ අනුව, රෙගුලාසියක් පැනවිය යුත්තේ කෙබඳු ආකාරයකින්ද යන්න, වටහා ගැනීම අපහසුය. කෙසේ වුවත්, පුද්ගලයින් කිහිපදෙනෙකුන් විසින් "හොඳ" දැල් පාඩු නැතහොත් මසුන් බහුල ස්ථාන වල ඒකාධිකාරය අයත් කරගෙන සිටීමේ තත්ත්වයක් පවතින හෙයින් හඳුනා ගැනීමේ සලකුණු වශයෙන් කොන්ක්‍රීට් කණු සිටුවීමෙන් හෝ වෙනත් එබඳු ක්‍රියා මාර්ගයක් මගින් හෝ මෙම පාඩු පිහිටි ස්ථානයන් හඳුනා ගැනීමේ හා සළකුණු කිරීමේ හැකියාව පිළිබඳව තවදුරටත් විමර්ශනය කළයුතුයයි නිර්දෙශ කරමි. මෙම පාඩු පිහිටි ස්ථාන සොයා ගැනීම හා ඒවා සළකුණු කිරීම ක්‍රියාත්මක කළ හැකි කාර්යයක් බව හෙළි වුවහොත් හා එම පාඩු සංඛ්‍යාව පිහිටා ඇති සීමාවන් වඩා දුර බැහැර නොවන බව හෙළිවුවහොත් එවිට කුසපත් ඇදීම මගින් මෙම පාඩුවල මසුන් ඇල්ලීම සඳහා ධීවරයින් තෝරා ගැනීම පිණිස වාර්ෂිකව ඉල්ලුම්පත් කැඳවීම හා මෙම විශේෂ පාඩුවල සිරගුවලෙයි ඇටවීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිණිස රෙගුලාසි වල, තවදුරටත් අවශ්‍ය විධානයක් පැනවිය යුතුය. මෙසේ බලපත්‍ර මත දැල් පාඩු ලබා ගන්නා අයගෙන් බලපත්‍ර ගාස්තුවක් අයකර ගැනීමටද පිළිවන් වනු ඇත.

(ආ 6) මෙයට විකල්ප වශයෙන්, බලය පැවරෙන විධානයක් රෙගුලාසිවල ඇතුළත් කළ හැකිය. මෙම විධානය ප්‍රකාරව යම් පාඩුවක් විශේෂ පාඩුවක් වශයෙන් තීරණය කොට සලකුණු කිමටීට හා එබඳු විශේෂ පාඩු වෙන්කර දීම සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ක්‍රියා මාර්ගය දැක්වීමට ධීවර අධ්‍යක්ෂට බලය ලැබෙනු ඇත.

(ආ. 7) **අරාල් ප්‍රදේශයේ සිරගු දැල් ධීවර අයිතිවාසිකම්.**—නවන්තුරේ ශාන්ත මේරි මුහුදු කුඩැල්ලන් ධීවර සමුපකාර සමිතිය විසින් කරුණු සැල කරමින් අරාල් ප්‍රදේශයට එපිටින් සිරගු දැල් ඇටවීමට අරාල් ප්‍රදේශයෙහි ධීවරයින් විසින් ඔවුනට ඉඩ නොදෙන බව පැවසූ අතර, ඔවුනට අරාල් ප්‍රදේශයේ සිරගු දැල් ඇටවීමට ඉඩ ලැබෙන අයුරින් රෙගුලාසි වල අවශ්‍ය විධාන පනවන මෙන් ඉල්ලා සිටියහ. අරාල් ප්‍රදේශයේ සිරගු දැල් ඇටවීම සම්බන්ධයෙන් කිසිම තහනමක් රෙගුලාසි වල අඩංගු නොවන අතර, එසේ හෙයින්, නවන්තුරේ ධීවරයින් විසින් මේ කාර්යය සඳහා රෙගුලාසි මගින් කිසියම් නිශ්චිත අවසරයක් ලබාගත යුතු නොවේ.

(ආ) **සිරගුදැල් මගින් මසුන් ඇල්ලීම පාලනය කිරීම හා විධිමත් කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා රෙගුලාසි වල විධිවිධාන ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා.**—මෙම ධීවර කර්මාන්තය පාලනය කිරීම හා විධිමත් කිරීම කෙරෙහි අදාල වන්නා වූ ක්‍රියා මාර්ගයන් සම්බන්ධයෙන් යෝජනා කිහිපයක්ම කරුණු සැලකිරීම් වලින් ඉදිරිපත් කෙරිණි. වැඩි වශයෙන්ම මෙම යෝජනා

වත් දැනට බල පැවැත්වෙන රෙගුලාසිවල අඩුලුහුඩුකම් හෝ දැනට බලපැවැත්වෙන විධිවිධානයන් ඒ අයුරින් තිබීමේ අසතුටුදායක තත්ත්වයන් පිළිබඳව විය.

**සිරගුවලෙයි පිළිබඳ විස්තරයක්.**—(ඇ. 1) රෙගුලාසිවල දක්වා ඇති සිරගුවලෙයි පිළිබඳ සම්මත සැලැස්ම වැරදි බවද, එය ඉවත් කොට දැල පිළිබඳව ප්‍රමාණවත් විස්තරයක් රෙගුලාසි වලට ආදේශ කළයුතු බවද පක්ෂ කිහිපයක් විසින්ම පෙන්වා දෙන ලදී. රෙගුලාසි වල දක්වා ඇති, සැලැස්ම නියම වශයෙන්ම කලපුවේ භාවිතා කෙරෙන්නාවූ සිරගුවලෙහි කිසිවකට සමාන නොවන බවට මම එකඟ වෙමි. කේ. සච්චිතානන්දන් සහ ඒ. තේවදාසන් විසින් පවත්වන්නට යෙදුණු සමීක්ෂණයෙන් (සිරගුවලෙයි—ලංකාවේ අක්‍රියාකාරී ධීවර ආම්පන්නයක් ලං. ධි. ප. ප්‍රවෘත්ති සංග්‍රහය—අංක 2, 21 වැනි කාණ්ඩය) ඒ බව පැහැදිලිව පෙනී යයි. වාර්තාවේ දක්වා ඇති පරිදි මූලික ආකෘතිය මාදැලකින් (වේලි) පැති දැලකින් (සිරහු) සහ කොටු වලින් (පෙරුක්කුඩ හා පඩවි) සමන්විත වේ. මෙම මූලික ආකෘතියට විවිධාකාර ස්වරූපයෙන් (ආකෘතියට වෙනස්ව) සෑදූ දැල් බොහොමයක් ඇති අතර, ඉහත සඳහන් කර්තෘවරුන් විසින් යාපනය කලපුවෙහි එබඳු විවිධාකාර දැල් 7 වර්ගයක් සොයා ගෙන ඇත. මසුන් ඇල්ලීමේ කාර්යයන් කෙරෙහි බලපෑම් ඇති කෙරෙන නොයෙකුත් සාධක අනුව, ඔවුන්ගේ දැල් වෙනස් කිරීම පිළිබඳව තීරණය කළ හැක්කේ, ඒ සම්බන්ධයෙන් මනා අවබෝධයක් හා දැනීමක් ඇති ධීවර කාර්මිකයින් විසින්මය. කරුණු මෙසේ හෙයින්, සම්මත ආකෘතියක් නියම කිරීම, පැහැදිලිවම පෙනෙන පරිදි, අහිතකර හා නිෂ්ප්‍රයෝජන කාර්‍යයකි. මෙම රූප සටහන සහ මෙම රූප සටහනට අනුකූලව තිබිය යුතු බවට නියම කෙරෙන, 4(1) වැනි වගන්තියද ඉවත් කළ යුතුයයි මම නිර්දේශ කරමි. ඒ වෙනුවට දැලෙහි අවශ්‍යතම ලක්ෂණයන් ප්‍රමාණවත් අයුරින් විදහා දක්වෙන සිරගු දැල් පිළිබඳ අර්ථ නිරූපනයක් රෙගුලාසිවලට ඇතුළත් කළ යුතුය.

(ඇ. 2) දැලෙහි ප්‍රමාණය සීමා කළ යුතු බවද, එසේ නැතහොත්, දැල සෑදී ඇති නානාවිධ උපාංග කොටස් සඳහා උපරිම ප්‍රමාණයක් නියම කළ යුතු බවද, සමහර පක්ෂ විසින් යෝජනා කරන ලදී. මෙයින් පළමුවැනි යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ, මෙසේ සීමාවක් නොපැනවුවහොත් වැඩියෙන් දැල් මිළදී ගැනීමට තරම් වත් සොහොසත් කම් ඇති ධීවරයිනට දුප්පත් ධීවරයිනට වැඩියෙන් වාසියක් සිදුවේය යන පදනම මතයි. දෙවැනි යෝජනාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් නොකෙරිණි. දැල් වල මිණුම් ප්‍රමාණය සම්බන්ධයෙන් දැනට කිසියම් සීමාවක් පැනවීම අවශ්‍යයයි මම නොසිතමි. කිසියම් ධීවරයෙකු විසින් සාමාන්‍ය ප්‍රමාණයට විශේෂ වශයෙන් විශාල සිරගු දැල් අටවන බව සඳහන් කෙරෙන සාක්ෂි කිසිවක් නොමැත. උපාංග කොටස් සඳහා වැඩිම මිණුම් ප්‍රමාණයන් කවරේදැයි තහවුරු කිරීමට හැකි ශිල්පීය විමර්ශනයන් කිසිවක් නොමැති බැවින්, උපාංග කොටස්වල ප්‍රමාණයන් සම්බන්ධයෙන් විවිධාකාර වෙනස් කම් අත්හදා බැලීමට ධීවරයිනට නිදහස තිබිය යුතුය.

(ඇ. 3) දැනට බලපැවැත්වෙන්නාවූ රෙගුලාසිවල 4(1) වගන්තියෙන් සිරගු දැල් සඳහා 1/2" අඩුම දැල් ඇස් ප්‍රමාණයක් නියම කොට ඇත. සිරගු දැල් සෑදීමට ගනු ලබන නූල් මි. මී. 11 සිට මි. මී. 15 දක්වා ප්‍රමාණයේ ඒවා බව ඉහතින් සඳහන් කෙරුණු සමීක්ෂණයෙන් පෙන්නුම් කෙරේ. (දැනට භාවිතා කරනු ලබන කුරලෝන් නූල් ප්‍රමාණයක් මි. මී. වලින් දක්වෙන අතර, කපු නූල් වලට අදාල වන අඟල් වලින් ප්‍රමාණය දැක්වීම තවදුරටත් අවශ්‍ය නොවේ.) දැනට භාවිතා කෙරෙන අඩුම ප්‍රමාණය මි. මී. 11 වශයෙන් තහවුරුව ඇති බව පෙනී යන අතර, මෙය 1/2" කට ඉතා සුළු ප්‍රමාණයකින් අඩුය. කුඩා මාළු පැටවුන් අසුවීමට ඉඩ ඇති හෙයින්, මි. මී. 11 ට අඩු ප්‍රමාණවලින් යුත් දැල් ඇස් පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතු බව සමහර පක්ෂවල අදහස විය. දැනට පවත්නා රෙගුලාසිවල නියම කර ඇති 1/2" අඩුම දැල් ඇස් ප්‍රමාණය වෙනුවට මි. මී. 11 අඩුම දැල් ඇස් ප්‍රමාණයක් යෙදිය යුතුයයි මම අදහස් කරමි.

**සිරගු දැල් ඇටවිය යුතු ගැඹුර සීමා කිරීම.**—(ඇ. 4) බාදිය කාලයේදී සිරගු දැල් ඇටවීම සඳහා අඩි 4 උපරිම ගැඹුරක් තිබිය යුතු යයි දැනටම බල පැවැත්වෙන රෙගුලාසි වල නිශ්චිත වශයෙන් දක්වා ඇත. ගැඹුර පිළිබඳ මේ මිණුම් ප්‍රමාණය එලෙසින්ම තිබිය යුතුද යන කාරණය පිළිබඳව ඒ ඒ පක්ෂ වල අදහස් එකිනෙකට පටහැනි විය. මෙසේ සීමා කර තිබීම මුළුමනින්ම ඉවත් කළ යුතු බව සමහර අයගේ මතයවූ අතර උපරිම ගැඹුර අඩි 8 හෝ 9 දක්වා දීර්ඝ කළ බව අනෙක් අයගේ මතය විය. තවත් සමහරකුගේ මතය වූයේ දැනට පවත්නා මිණුම් ප්‍රමාණය එලෙසින්ම තිබිය යුතු බවයි. මෙයට හේතුව වශයෙන් දක්වන ලද්දේ, අඩි 4 ට වැඩි ගැඹුරක් ඇත්තේ මසුන් ඇල්ලීමේ කාර්යයන් මගින් අවහිර නොකළ යුතු ඇළමාර්ග වල පමණක් බවයි.

(ඇ. 5) ප්‍රධාන වශයෙන්ම මෙම තත්ත්වය පිළිබඳව නිශ්චය කර ගැනීමේ අරමුණ ඇතිව, කේ. සච්චිතානන්දන් සහ ඩබ්ලිව්. කේ. ටී. පෙරේරා යන මහතුන් විසින් සමීක්ෂණයක් පවත්වන ලදී. සමීක්ෂණයට භාජනය කරනු ලැබූ වර්ග සැතපුම් 71 ප්‍රදේශය තුළ අඩි 2½ කට වැඩියෙන් ගැඹුර ඇති ප්‍රදේශය තුළ මාර්ගයක් සෑදී ඇති අයුරින් සමතාවකින් යුතුව දිගටම පිහිටා ඇති බැව්, පෙනී යන්නේ යැයි, යාපනය කලපුවේ භූ ලක්ෂණ හා උප තට්ටුව පිළිබඳ ඔවුන්ගේ වාර්තාවෙන් හෙළි කෙරෙයි. (ලං. ධි. ප. ප්‍ර. සං. අංක 2, 21 වැනි කාණ්ඩය) යාපනය කලපුව ඉතා නො ගැඹුරු කලපුවක් වන අතර, මෙහි ඇති ඇල මාර්ග කිහිපයේ ගැඹුර සාමාන්‍ය වශයෙන් අඩි 3-5 දක්වා වේ. විමර්ශනයන් හිදී දක්නට ලැබුණු උපරිම ගැඹුර අඩි 13 කි. ගැඹුර අඩි 4 කට වැඩි ස්ථානවල සිරගු දැල් ඇටවීමේදී එම දැල් යට කී ඇල මාර්ග කරා වැටෙන්නේය යන මතය, එම පරීක්ෂණයක් මගින් සනාථ කෙරෙන බව පෙනී යයි. සිරගු දැල් මගින් මසුන් ඇල්ලීම මෙන්ම අනෙකුත් පන්න ක්‍රමවලටද යහපත නකා යාපනය කලපුවෙහි පිහිටා ඇත්තාවූ ඇල මාර්ග කිහිපය තුළ මසුන් එහා මෙහා යාමට මෙන්ම ධීවර යාත්‍රා ගමනාගමනද නිදහසේ ඉඩ තිබෙන්නට හැරීම අත්‍යවශ්‍ය කාරණයකි.

(ඇ. 6) එබැවින්, රෙගුලාසි වල නිශ්චිත වශයෙන් දක්වා ඇති අඩි 4 උපරිම ගැඹුර යාපනය කලපුව සම්බන්ධයෙන් එසේම තිබිය යුතුයයි මම නිර්දේශ කරමි.

(ඇ. 7) ඊට අමතරව නියම වශයන් දක්වා ඇති ඇල මාර්ග 5 ක් තුළ ඒවාට අවහිරකම් සිදුවන අයුරින් සිරගු දැල් ඇටවීම දැනට බලපවත්නා රෙගුලාසිවල 4(2) (IV) වැනි වගන්තිය මගින් තහනම් කරනු ලැබ ඇත. ලකුණු කර ඇති හෝ නොමැති යාපනය කලපුවේ වෙනත් සියළුම ඇල මාර්ග වලටද, බල පැවත්වෙන අයුරින් මෙම විධානය පුළුල් කළ යුතුය.

(ඇ. 8) මේ අයුරින් කලපුවේ මායිම් තුළ ගැඹුර පිළිබඳ සීමාව අදාල විය යුතු නමුදු කලපුවෙන් බැහැර මුහුද සම්බන්ධයෙන් එය අදාල නොවනු ඇත. සිරගු දැල් කිහිපයක්ම දත් මුහුදේ අටවනු ලබන අතර, මෙසේ මුහුදේ අටවනු ලබන සිරගු දැල් මෙම උපරිම ගැඹුර පිළිබඳ නියමයෙන් නිදහස් කළ යුතුය. මෙම සිරගු වලෙහි දැල් සම්බන්ධයෙන් ඇති විය හැකි ගැටළු වූ කලී යාත්‍රා ගමනාගමනයට අවහිරකම් සිදුවීම හෝ ඒවා කලපුවකට හරහා අටවනු ලැබේ නම්, එයින් මසුන් එහා මෙහා යාම් ඊම් කෙරෙහි අවහිරකම් සිදුවීමයි. එබැවින් මුහුදේ අටවා ඇති සිරගු දැලක් නිසා, යාත්‍රා ගමනාගමනයට, මසුන් කලපුව කරා ඇදී යාමට හෝ වෙනත් වර්ග වල ධීවර ආම්පන්න ක්‍රියා කරවීමට අවහිර කම් සිදුවන බවක් පෙනී යන්නේ නම් එසේ අටවා ඇති ඕනෑම සිරගු දැලක් ස්වකීය අභිමතය පරිදි ඉවත් කරන මෙන් නියෝග කිරීමට ධීවර අධ්‍යක්ෂ වෙත බලතල පැවරිය යුතුයි. ධිවරයෙකු විසින් ඇල මාර්ගයක් අසුවන පරිදි, දැලක් අටවා ඇති අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි, මෙම විධානය කලපු ප්‍රදේශයටද, බල පැවැත්වෙන සේ දීර්ඝ කිරීම ඥානාන්විත වේ.

(ඇ. 9) කලපුවේ ගැඹුර සම්බන්ධයෙන් අදාල නොවන හා එහෙත් ඇල මාර්ග වලට අවහිරකම් සිදු කිරීම සම්බන්ධයෙන් සමහර පක්ෂ විසින් තවදුරටත් කරුණු සැළ කිරීමක් ඉදිරිපත් කරන ලදී. මෙය මීගමුව කලපුවේ පාවිච්චි කෙරෙන්නාවූ කට්ටූ දැල් වලට සමාන කොටු දැලක් ධීවරයින් කොටසක් විසින් ඉස්සන් ඇල්ලීම සඳහා පාවිච්චි කිරීම සම්බන්ධයෙනි. මේ දැල ඇල මාර්ග හරහා අටවන බවටද, ඒ හේතුකොට ගෙන මසුන් එහා මෙහා යාමට හා යාත්‍රා ගමනාගමනයට අවහිර කම් සිදු වන බවටද, කරුණු ඉදිරිපත් කෙරිණි. ඇල මාර්ග ඔස්සේ එහා මෙහා යන මසුන් උගුලට අසුකර ගැනීමෙහි යෙදෙන සිරගු දැල් විශාල සංඛ්‍යාවකට මෙයින් බලවත් හානියක් සිදුවන බැවින්, ක්‍රියාවේ යෙදවමින් පවතින සංඛ්‍යාව ඉතා සුළු ප්‍රමාණයක් වන මෙම දැල පාවිච්චි කිරීම තහනම් කළ යුතු බව මගේ හැඟීමයි.

(ඇ. 10) පත්තෙයි දියමංකඩ කෙළවර දෙපැත්තෙහිම සිරගු දැල් ඇටවීම කෙරෙන බවද එයින්, මසුන් එහා මෙහා ගාමට හා යාත්‍රා ගමනාගමනයට අවහිරකම් සිදු වන බවද, නවන්තුරේ ධීවරයින් විසින් පෙන්වා දෙන ලදී. දියමංකඩෙහි සිට යාර 50 ක ප්‍රදේශය තුළ දෙපැත්තෙහිම සිරගු දැල් ඇටවීම තහනම් කෙරෙන විධානයක් රෙගුලාසිවලට ඇතුළත් කරන මෙන් ඔවුහු ඉල්ලා සිටියහ. මෙසේ විධානයක් පැනවීම අවශ්‍ය බවට මා එකඟ වන අතර, ඒ අනුව රෙගුලාසි වල විධානයක් පනවන මෙන් නිර්දේශ කරමි.

(ඇ. 11.) **දැල් එසවීම**—සෑම සිරගු දැලක්ම සෑම සෙනසුරාදා, ඉරිදා දිනවලදී එනම් දින 6 කට වරක් එසවීම සඳහා දැනට බලපැවැත්වෙන රෙගුලාසිවල 4(2) (1) වගන්තියෙන් විධානයන් සලස්වා තිබේ. සමහර විට මෙය එවකට බල පැවැත්වුන, සාමාන්‍ය සිරිතක් නීතිමය සංග්‍රහයකට එක් කිරීමක් විය හැකිය. මේ ආකාරයේ එක තැන සිටුවා ඇති හා අක්‍රියාකාරී දැලක් එසවීමට අවශ්‍යතාවයක් ඇති වනුයේ මසුන් ගැන සලකා බලන කළ එය ස්වාභාවික පරිසරයට අනුකූල දෙයක් බවට පත්වීම වළක්වා ගැනීමයි. එනම් දැල මෙසේ එක තැන තිබීම නිසා, මසුන් ඊට පුරුදු වූවහොත් කල් යාමේදී ඊට අසු නොවී දැල මගහරවා යාමට උන් පුරුදුවන අතර, එවිට උගුලක් වශයෙන් එහි ඇති වටිනාකම නැතිව යනු ඇත. මේ කාර්යය සඳහා සෑම දින 6 කට වරක් මෙන් ඉතා කෙටි කාලයකදී දැල එසවීම අවශ්‍ය නොවුවා විය හැකිය. නමුත්, කපු නූලෙන් සෑදූ දැල් පාවිච්චි කළ කාලයේදී එසේ කෙටි කාලසීමාවක්

තුළ දී දැල් ගොඩට ගෙන දිරා යාමෙන් වැළැක්වීම සඳහා ආරක්ෂක සායම් මිශ්‍රණයක තම්බා වේලා ගැනීමට නිසැක වශයෙන්ම අවශ්‍ය වන්නට ඇත. කෘත්‍රිම දැල් භාවිතය ඇරඹීමත් සමග දැල් වලට අහිතකර බලපෑම් සිදුවීමක් නොමැතිව. ඒවා වැඩි කාලසීමාවක් තුළ ජලයේ තිබෙන්නට හැරීමට හැකි අතර, මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දැන් මෙම රෙගුලාසිය අනුව, කටයුතු නොකෙරෙමින් පවතී. දැන් ධීවරයින් විසින් ඔවුන්ගේ පහසුවට අනුව, සිතැඟි පරිදි, දැල් ඔසවනු ලබන නමුදු දැල් එසවීම අවශ්‍ය කෙරෙන ප්‍රධාන කාර්යය පිළිබඳව සලකා බැලීමේදී සෑම දැලක්ම එකම දිනයක දී එසවිය යුතු බව පෙනී යයි. දැල් එසවීම දින 15 කට වරක් කළ යුතු බවට නියම කෙරෙන පරිදි, රෙගුලාසිය වෙනස් කළ යුතු යැයි පක්ෂ කිහිපයක්ම කියා සිටියහ.

(ඇ.12) යටත් පිරිසෙයින් මසකට වරක් දැල් ඔසවනු ලබන්නේ නම් එය ප්‍රමාණවත් බව පෙනී යයි. මෙය අනිවාර්ය කළ යුතු වේ. අවශ්‍යයැයි හැඟෙන්නේ නම් මේ අතරතුර දී ඔවුන්ගේ දැල් එසවීමට ධීවරයින්ට බාධාවක් ඇති නොවේ. දැල් එසවිය යුතු කාලසීමාව ඉතා පහසුවෙන් පහත දැක්වෙන පරිදි නියම කළ හැකි බව ද පෙනී යයි. එනම් තුදුස්වක දින (පුර පසළොස්වක දිනට පෙර දින) මධ්‍යාහ්නයට පෙර සිට පුර පසළොස්වක දින මධ්‍යාහ්නය දක්වා කාලය තුළදී යි. කෙසේ වුවද දැල් එසවීම සඳහා වෙනත් දිනයක් ලබාගැනීමට ධීවරයින් කැමති වන්නේ නම් මසකට වරක් දැල් එසවිය යුතු දිනය ධීවර අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළකෙරෙන දැන්වීමක් මගින් ප්‍රසිද්ධියට පත් කෙරෙන බව රෙගුලාසිවල සඳහන් කෙරෙන්නේ නම් එය ප්‍රමාණවත් වනු ඇත.

(ඈ) **වෙනත් නිර්දේශයන්.**—(ඇ. 1) සිරගු දැල් සම්බන්ධයෙන් දැනට බලපැවැත්වෙන රෙගුලාසිවල තිබෙන සාමාන්‍ය විධිවිධාන අදාල වන්නේ යාපනය කලපුව සහ දූපත් වශයෙන් අර්ථ නිරූපණය කොට දක්වා ඇති ප්‍රදේශය සඳහා පමණක් වන අතර, ලියාපදිංචි කිරීම, සලකුණු කිරීම යනාදිය සම්බන්ධයෙන් දක්වා ඇති විධිවිධාන අදාල වන්නේ වලිච්චම්බු වරායට හා අරියාලෙයි වරායේ කොටසකට පමණි. (සමහර විට ඒ අවධියේදී සිරගු දැල් විශාල සංඛ්‍යාවක් ඒකරාශීව තිබූ ප්‍රදේශය මෙය විය හැකිය.) යාපනය කලපුව හා දූපත් වශයෙන් අර්ථ නිරූපිත ප්‍රදේශයේ සීමාවන්ට එපිටින් දැනට මත් සිරගු දැල් ගණනාවක්ම ඇත. සිරගු දැල් සම්බන්ධ සියලුම රෙගුලාසි, එම දැල් පාවිච්චි කරනු ලබන යාපනය ප්‍රදේශයේ සියළුම දිස්ත්‍රික්කවලට අදාල විය යුතුය. එබැවින්, සිරගු දැල් පිළිබඳ රෙගුලාසි වල විෂය ප්‍රමාණය යාපනය දිස්ත්‍රික්කයට යාබද ලංකාව සතු සියළුම ජලාශයන්ට අදාල වනසේ දීර්ඝ කළයුතු බව මම නිර්දේශ කරමි.

(ඇ. 2) පිටි දැල් අටවා තිබීම හේතුකොටගෙන අවස්ථා කිහිපයක දීම නාවුක හමුදාවේ බෝට්ටුවල ප්‍රොපෙලරවලට හානි සිදුවූ බැවින්, කරෙයිනගර් නාවුක හමුදා ස්ථානයට පිවිසෙන මාර්ගය වටා පිහිටි මුහුදු ප්‍රදේශය ඇළ මෙම දැල් ඇටවීම තහනම් කරන මෙන් 1968 දී නාවුක හමුදාව විසින් ඉල්ලීමක් කරණ ලදී. මෙසේ තහනම් කරණ මෙන් ඉල්ලා සිටි ප්‍රදේශය නිශ්චය කරනු ලැබූ අතර, රෙගුලාසි ප්‍රතිශෝධනය කරන අවස්ථාවකදී අවශ්‍ය විධානයන් රෙගුලාසිවල අන්තර්ගත කිරීම සඳහා ඒ පිළිබඳව සැලකිල්ල යොමු කොට තිබුණි. එබැවින්, මෙම ප්‍රදේශය සිරගු දැල් ඇටවීම සඳහා තහනම් ප්‍රදේශයක් වශයෙන් රෙගුලාසිවල ප්‍රකාශයට පත් කළ යුතුය. මෙම ප්‍රදේශයේ සීමාවන් පහත දැක්වේ—

> " කරෙයිතීවු තොටුපල ලක්ෂ්‍යය හා කයිට්ස් තොටුපල ලක්ෂ්‍යය සම්බන්ධ කෙරෙන රේඛාවක් මගින්, කයිට්ස් දූපතේ උතුරු අන්ත කෙළවර දක්වා, උතුරු වෙරළ ඉම මගින් එතැන් සිට එලුවතිවු දූපත් වල උතුරු අන්ත කෙළවර හා එතැන් සිට කෝවිලම් ලක්ෂ්‍යයට අඳිනු ලබන රේඛාවක් මගින් කෝවිලම් ලක්ෂ්‍යයට දකුණින් කරෙයිතීවු වෙරළ ඉම අතර, වටවී ඇති ජලාශය මුළුමනින්ම ඇතුළත් වේ."

(ඇ. 3) දැල් එකිනෙකට අටවා තිබෙන අයුරු හා දැල් අතර, දුර ප්‍රමාණයන් සම්බන්ධයෙන් සිරගු දැල් ධීවරයින් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් හෝ අතර පැන නැගිය හැකි ආරවුලක් බේරුම් කිරීම සඳහා ක්‍රියා කිරීම ධීවර අධ්‍යක්ෂ වෙත බලතල පැවරෙන විධානයක් රෙගුලාසි වල ඇතුළත් විය යුතුය. ආරවුලක් හටගත් අවස්ථාවක දී දැල් අතර දුර ප්‍රමාණය නියම කිරීමට හෝ එබඳු දැල් ඇටවිය යුතු වෙනස් ආකාරයන් දැක්වීමට හෝ ධීවර අධ්‍යක්ෂ වෙත බලතල පැවරෙන විධානයක් රෙගුලාසිවලට ඇතුළත් කළ යුතුය.

(ඇ. 4) නියමිත ප්‍රදේශයක 'සිරගු දැල් 8 කට වැඩියෙන් පාවිච්චි කිරීම 5 (1) වගන්තියේ අතුරු විධානය මගින් සීමා කෙරේ. මෙසේ සීමාවක් පනවා ඇත්තේ, කවර හේතුවක් නිසාදැයි නොපැහැදිලි නමුදු, සමහර විට ඒ අවධියේදී ඒ ප්‍රදේශයන් සම්බන්ධයෙන් මෙසේ සීමාවක් පැනවීමට යම් අවශ්‍යතාවයක් පැන නැගෙන්නට ඇත. මෙසේ සීමා කර තිබීම ඉවත් කරන මෙන් කරුණු ඉදිරිපත් නොකෙරිණි. එබැවින්, එය නොවෙනස්ව පැවතිය යුතුය. කෙසේ වුවද, සිරගු දැල් ලියාපදිංචි කිරීම සඳහා නියමයක් නැති හෙයින්, යම් ප්‍රදේශයක සිරගු දැල් ඇටවීමට බලාපොරොත්තු වන දැල් අයිතිකරුවන් 8 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සිටින අවස්ථාවක දී, අවසර දිය යුතු සිරගු දැල් 8 තෝරා ගැනීම ධීවර අධ්‍යක්ෂ විසින් කුසපත් ඇදීම මගින් සිදු කළයුතු බවට විධානයක් පැනවිය යුතුය.

(ඇ. 5) දැනට බලපැවැත්වෙන රෙගුලාසිවල 4, 5 සහ 5 ඒ දරණ වගන්ති සිරගු දැල්වලට අදාල වගන්තිවෙයි. මෙම වාර්තාවේ දක්වා ඇති නිර්දේශයන් පිළිගනු ලැබුවහොත්, පහත දැක්වෙන උප වගන්ති ඉවත් කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අවශ්‍යවනු ඇත.

| | | |
|---|---|---|
| 4 (1) වගන්තිය | ... | සංශෝධනය. |
| 4 (1) වගන්තියේ අතුරු විධානය | ... | ඉවත් කිරීම. |
| 4 (2) (I) වගන්තිය | ... | සංශෝධනය. |
| 4 (2) (II) | ... | සංශෝධනය. |
| 4 (2) (IV) | ... | සංශෝධනය. |
| 5 (1) වගන්තිය | ... | ඉවත් කිරීම. |
| 5 (1) වගන්තියේ අතුරු විධානය | ... | සංශෝධනය. |
| 5 (2) වගන්තිය | ... | ඉවත් කිරීම. |
| 5 (3) වගන්තිය | ... | ඉවත් කිරීම. |
| 5 (4) වගන්තිය | ... | ඉවත් කිරීම. |
| 5 (5) වගන්තිය | ... | සංශෝධනය. |
| 5 (6) වගන්තිය | ... | ඉවත් කිරීම. |
| 4 (1) වගන්තිය පිළිබඳ හැඳින්වීමෙහි දක්වා ඇති සිරගු දැලක රූප සටහන සහ විශේෂ විස්තර | ... | ඉවත් කිරීම. |

පහත සඳහන් වගන්ති පමණක් නොවෙනස්ව පවතිනු ඇත:—

4 (2) (III) වගන්තිය.

5 (7) වගන්තිය.

5 ඒ වගන්තිය.

(ඇ. 6) සංශෝධන, වලට අමතරව අළුත් වගන්ති ගණනාවක්ම ඇතුළත් කළ යුතුවේ. මෙම වගන්ති මුළුමනින්ම පාහේ සංශෝධනය කිරීම හෝ අළුතින් යෙදිය යුතු වීම නිසා, දැනට බලපැවැත්වෙන රෙගුලාසිවල 4, 5 හා 5 ඒ වගන්තිද අස්කොට සිරගු දැල්වලට අදාල සම්පූර්ණ නව රෙගුලාසි මාලාවක් කෙටුම්පත් කිරීම වඩාත් යෝග්‍ය වේ,

### නිර්දේශයන්හි සාරාංශය

(1) සිරගු දැල් වලට අදාල රෙගුලාසි වල විෂය ප්‍රමාණය යාපනය දිස්ත්‍රික්කයට යාබද ලංකාව සතු සියළුම ජලාශයන්ට බලපැවැත් වෙන සේ දීර්ඝ කළ යුතුය.

(2) දැනට බලපැවැත්වෙන රෙගුලාසිවල දක්වා ඇති සම්මත රූප සටහන සහ විශේෂ විස්තර වෙනුවට සිරගු දැල් පිළිබඳ අර්ථ නිරූපනයක් රෙගුලාසිවලට ඇතුළත් කළ යුතුය.

(3) සිරගු දැල් සඳහා නියම කළ යුතු ඇසක අඩුම ප්‍රමාණය මි.මි. 11 ක් විය යුතුය.

(4) බාදියෙහි සිරගු දැල් ඇටවීම සඳහා දැනට නියමිත අඩි 4 උප රිම ගැඹුර පිළිබඳ නියමය සීමාව කලපුව සම්බන්ධයෙන් එසේම තිබිය යුතුය. මුහුදේ දැල් ඇටවීම සම්බන්ධයෙන් උපරිම ගැඹුර පිළිබඳ නියමයක් පැනවීම අවශ්‍ය නොවේ.

(5) සිරගු දැල් ලියාපදිංචි කළයුතු බවට නියමයක් නොපැනවිය යුතුය.

(6) සිරගු දැල් වල සෑම කොටසකට අයිතිකරුගේ නම් සායම් වර්ගයකින් සලකුණු කළ යුතු බවට විධානයක් පැනවිය යුතුය.

(7) නියම කර ඇති ඇලමාර්ග වලට අමතරව යාපනය කලපුවේ සියළුම ඇලමාර්ග ඇතුළු වන පරිදි, 4(2) (IV) වැනි වගන්තියේ විෂය ප්‍රමාණය දිර්ඝ කළ යුතුය.

(8) මසකට වරක් බැගින්, නියම කරනු ලබන කාලසීමාවක් තු දී දැල් එසවීම අනිවාර්ය කළ යුතුය.

(9) ආරාවුලක් හටගත් අවස්ථාවකදී දැල් අතර, දුර ප්‍රමාණ ගත් දැල් ඇටවීම සඳහා විකල්ප ආකාරයෙන් හෝ ස්වකීය අභිමත පරිදි නියම කිරීමට ධීවර අධ්‍යක්ෂ වෙත බලතල පැවරිය යුතුය.

(10) කිසියම් දැල් පාඩුවක් (දැල් අටවනු ලබන ස්ථානයක් විශේෂ පාඩුවක් වශයෙන් තීරණය කිරීමට හා සළකුණු කිරීම ධීවර අධ්‍යක්ෂට ඉඩ ලැබෙන්නාවූ බල‍ය පැවරෙන විධානයක රෙගුලාසිවලට ඇතුළත් කළ යුතුය. එබඳු විශේෂ දැල්පාඩු වෙන කිරීම සඳහා බලපත්‍ර ගාස්තුවක් අය කිරීම පිළිබඳව සලකා බැලි යුතුය.

(11) කලපුවට මසුන් සංක්‍රමණය වීම හෝ යාත්‍රා ගමනාගමන හෝ වෙනත් ධීවර ආම්පන්න ක්‍රියාවේ යෙදවීමට හෝ බාධා සිදුවන අයුරින්, මුහුදේ හෝ කලපුවේ හෝ අටවා ඇති සිරගු දැල් ඉවත් කර ගන්න මෙන් ස්වකීය අභිමතය පරිදි නියෝග කිරීමට ධීවර අධ්‍යක්ෂ වෙත බලතල පවරා දිය යුතුය.

(12) ප. ව. 6 සිට පෙ. ව. 6 දක්වා කාලය තුළ කිසියම් වාහනයක හෝ යාත්‍රාවක හෝ සිරගු දැල් ප්‍රවාහනය කිරීම තහනම් කළ යුතුය.

(13) කලපුව තුළ බෝට්ටුවල සිට දැඩි රශ්මියෙන් යුත් ලාම්පු පාවිච්චි කිරීම තහනම් කළ යුතුය.

(14) කලපුවේ ඇල මාර්ග හරහා තව්වුදැල් දැමීම තහනම් කළ යුතුය.

(15) පත්තෙනි දිය මංකඩෙහි යාර 50 ක ප්‍රදේශය තුළ එහි දෙපැත්තෙහිම සිරගු දැල් ඇටවීම තහනම් කළ යුතුය.

(16) කරෙයිනගර් වලට එපිටින් මුහුදේ නියමිත ප්‍රදේශයක් සිරගු දැල් ඇටවීම සඳහා තහනම් ප්‍රදේශයක් ලෙසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

(17) නියමිත ප්‍රදේශය තුළ ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වේ නම්, කුසපත් ඇදීම මගින් හෝ සිරගු දැල් 8 ක් තෝරා ගැනීමට ධීවර අධ්‍යක්ෂට බලය ලැබෙන විධානයක් 5 (1) වගන්තියේ අතුරු විධානය යටතේ පැනවිය යුතුය.

**ස්තුතිය**

රෙගුලාසි පිළිබඳව කරනු ලැබූ මෙම විමර්ශණය සම්බන්ධයෙන් අවශ්‍යවූ සමීක්ෂණ දෙක පැවැත්වීමට හා මෙම පරීක්ෂණයට හා සාකච්ඡාවන්ට සහභාගිවීම ගැන පර්යේෂණ නිලධාරි කේ. සච්චිතානන්දන් මහතාටද, ඔහුගේ සහායකයින්වූ, ඒ. තේවදාසන් සහ ඩබ්ලිව්. කේ. ටී. පෙරේරා මහතුන්ටද, මෙම පරීක්ෂණයේදී සහාය දීම ගැන කලින් කළමනාකාර නිලධාරිනී, වශයෙන් සිටි සී. සී. ද ඉසෙඩ්. පීටර්ස් මහත්මියටද, ප්‍රාදේශීය ධීවර පරීක්ෂක ටී. ගුණනායගම් මහතාට හා යාපනය කොට්ඨාශයේ අනෙකුත් නිලධාරීන්ටද, ලිපිකරු ඒ. සිවදාසන් මහතාටද, ලඝුලේඛක සී. ඇල්. හෙන්රි සහ සී. එල්. රුද්‍රීගු මහතුන්ටද මගේ කෘතඥතාවය පිරිනමමි.

වී. එල්. සී. පීටර්ස්,
ධීවර සහකාර ලේකම්.

1972 අගෝස්තු 10 දින දිය.

02-517—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

# මිල පාලන දැන්වීම්

අංක ඇම. ඇන්/1973/3 දරණ ආහාර මිළ නියෝගය

**මිළ පාලන පනත**

නියෝගය

මන්නාරම් පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් කන්දසාමි සදවරසුන්දරම් වන මම, (173 පරිච්ඡේදය) මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බල තල අනුව—

(1) 1967 දෙසැම්බර් මස 10 වන දින අංක 14,778/2 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක විසින් පාන් සම්බන්ධයෙන් නිකුත්කර ඇති 1967 නොවැම්බර් 30 වන දින අංක ඇම්.ඇන්/4/1967 දරණ ආහාර මිළ නියෝගය මේ මොහොතේ පටන් මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් මිළ මන්නාරම් පාලන දිස්ත්‍රික්කය තුළ පිළිවෙලින් අවුන්ස 16 හා 8 වේ පාන් ගෙඩි මේ දැන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බවත් එකී මිළයට වැඩියෙන් එම ප්‍රදේශවල එම පාන්ගෙඩි නොවිකිණිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම මිළ නියෝගයෙන් අවුන්ස 16 යේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන් මන්නාරම් පාලන දිස්ත්‍රික්කය තුළ කොයියම් ප්‍රදේශයකවත් අවුන්ස 8 කට වඩා බර පාන් ගෙඩියක් හෝ පාන් ගෙඩියෙන් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණිය යුතු බවත් ;

(4) මෙම මිළ නියෝගයෙන් අවුන්ස 8 වේ පාන් ගෙඩියකට නියමිත වැඩිම මිළේ අනුපාතය අනුව වැටහෙන මිළට වැඩියෙන්, මන්නාරම් පාලන දිස්ත්‍රික්කය තුළ කොයියම් ප්‍රදේශයකවත් අවුන්ස 8 කට වඩා බර නොවූ පාන් ගෙඩියක් හෝ පාන්ගෙඩියකින් අවුන්ස 8 කට වඩා බර නොවූ කිසියම් කොටසක් නොවිකිණි යුතු බවත් ;

(5) පාන් විකුණනවිට ඔතා දෙනු ලබන දෙයක් වෙතොත්, එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන්වලට ඇතුලත් බවත් ;

(6) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති මන්නාරම පාලන දිස්ත්‍රික්කයේ සැම ප්‍රදේශයකම සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ කිසියම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් පාන් ඇති වෙළෙන්දෙකු මෙම නියෝගයෙන් පාන් සඳහා නියමිත වැඩිම මිළ ගණන් සටහන් කගරන ලද දැන්වීමක් පැහැදිලිව පෙනෙන සේ, එම ස්ථානයේ හෝ එම වාහනයේ තැබිය යුතු බවත්,

(7) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති මන්නාරම් පාලන දිස්ත්‍රික්කය තුළ සැම ප්‍රදේශයකම පාන් විකුණන සැම කෙනෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය :

(ආ) විකුණූ පාන් ගෙඩියේ විස්තරය :

(ඇ) විකුණූ පාන් ප්‍රමාණය ;

(ඈ) විකුණූ පාන්වලට ගෙවූ මුදල ;

ඇතුලත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද, මෙම නියෝගයෙන් නියම කරමි.

(8) තවද, ''අවුන්ස'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත අවුන්සයේ බර බවද නියෝග කරමි.

1973 ජනවාරි මස 25 පූ. හා. 11 ට මන්නාරමේ දී අත්සන් තබන ලදී.

කේ. සදවරසුන්දරම්,
මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර
(ආහාර) මිළ පාලක තැන.

**උපලේඛනය**

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| විස්තරය | අවුන්ස 8 කට වඩා බර පාන් සඳහා අදළ වැඩිම මිළ | අවුන්ස 8ක් හෝ ඊට අඩු පාන් සඳහා අදල වැඩිම මිළ |
| | ශත | ශත |
| පාන් අවුන්ස 16 ක් ... | 41 ... | 21 |

02-684—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**අංක වී 112 දරණ ආහාර මිළ නියෝගය**

**මිළ පාලන පනත (173 වන පරිච්ඡේදය)**

**නියෝගය**

